# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

# 2021




**කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்**
**பேராதனைப் பல்கலைக்கழகம்**

**POSTGRADUATE INSTITUTE OF AGRICULTURE**
**UNIVERSITY OF PERADENIYA**

# වාර්ෂික වාර්තාව - 2021




## කෘෂිකර්මවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## දැක්ම

කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි සහ පර්යේෂණයන්හි විශිෂ්ට වූ ගෝලීය තරඟකාරී මධ්‍යස්ථානයක් බවට පත්වීම.

## මෙහෙවර

උසස් ගුණාත්මක බවින් යුත් පශ්චාත් උපාධි අධ්‍යාපනය සපයමින් උසස් ඵලදායි සහ නව්‍යතාවයෙන් යුත් ප්‍රමුඛ පර්යේෂණයන් දිරිගන්වමින් කෘෂිකර්මාන්තය සහ ඒ හා බැඳුණු ක්ෂේත්‍රයන්හි ප්‍රවීනතාවයෙන් හෙබි වෘත්තිකයන් බිහි කිරීම

## ඉලක්ක

- සියලු පශ්චාත් උපාධි වල ගුණාත්මක භාවය සහ අදාළත්වය පවත්වාගෙන යාම.
- උසස් ගණයේ ගුණාත්මක පර්යේෂණ, නව නිපැයුම් සහ ධාරිතා වර්ධන කටයුතු දිරිගන්වමින් විශිෂ්ට පර්යේෂණ සංස්කෘතියක් කරා මෙහෙයවීම.
- ප්‍රවීණ සහ කැපවීමෙන් ක්‍රියා කරන අධ්‍යයන, පරිපාලන සහ සහයක කාර්ය මණ්ඩලයකින් යුක්ත වීම.
- ශිෂ්‍ය සහ ආයතනික කාර්ය මණ්ඩලය අතර උසස් වෘත්තිමය කුසලතා, ආචාර ධර්ම, යහ පැවැතුම් සහ නායකත්ව ගුණාංග ස්ථාපිත කිරීම.
- දැනුම් තොරතුරු සියලු පාර්ශවකරුවන්ට වෙත ලබාදීම.
- යහපාලනය ප්‍රවර්ධනය කිරීම.
- කාර්යක්ෂම පරිපාලනයක් සහ තිරසර මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාම.

# අධ්‍යක්ෂකතුමාගේ ප්‍රකාශය/ සමාලෝචනය



කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 9 දරන ප්‍රඥප්තිය යටතේ මෙරට පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනයක් වශයෙන් ස්ථාපිත කරන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව කමනාකරණ මණ්ඩලයක මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වනු ලබයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ රට තුළ පවත්නා ධාරිතාවය වැඩි දියුණු කිරීමත් ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් පුළුල් වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවැසි මනා පුහුණුවක් ලද විද්‍යාත්මක දැනුමෙන් සපිරි පිරිසක් බිහි කිරීමත් ය. දශක හතරකට ආසන්න කාලයක් පුරාවට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන මෙම ජාතික මෙහෙවරෙහි නියැළෙන්නේ අංග සම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ කටයුතු පිළිබඳ මෙරට සහ කලාපීය විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වෙමිනි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් විද්‍යාපති උපාධි පාඨමාලා (ව්‍යාපාර පරිපාලනපතිද ඇතුළුව) (SLQF L9) සහ පාඨමාලා වැඩ හා පර්යේෂණ වශයෙන් (SLQF L10) 30ක් ද පර්යේෂණ උපාධි (දර්ශනපති සහ දර්ශනශූරී වශයෙන් ) පාඨමාලාවන් ද අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ පිරිනමනු ලබයි . තමන්ටම අනන්‍ය වූ සුවිශේෂී ඉගැන්වීම් සහිත කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බොහොමයක්ම පාඨමාලා මෙහෙයවනු ලබන්නේ පුළුල් ඉගැන්වීම් සහ පර්යේෂණ අත්දැකීම්වලින් පරිණත විශ්වවිද්‍යාල, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, ජාතික සහ අන්තර්ජාතික ආයතන සහ පෞද්ගලික ආයතනයන්හි අනුයුක්ත බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් මගිනි. කෘෂිකර්ම විද්‍යා පීඨය හරහා අති නවීන තාක්ෂණික උපකරණ සහිත අංග සම්පූර්ණ විද්‍යාගාර පහසුකම් යටතේ ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය ලබාදෙයි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මේ වන විට අවධානය යොමු කර ඇත්තේ අධ්‍යයන දැනුම ලබාදීමට පමණක් සීමා නොව බොහෝ පර්යේෂණ සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට ය.

පසුගිය දශක හතරක කාල පරිච්ඡේදය තුළ විවිධ වූ උපාධි අධ්‍යයන පාඨමාලා හරහා ශිෂ්‍ය බඳවා ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් ආයතනය හිමිකරගෙන ඇති අතර එය ආරම්භගේ දී සිසුන් 19 ක් වූ නමුත් මේ වන විට වාර්ෂිකව සිසුන් 500 ඉක්මවා ඉහළ ගොස් ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රගේ ඉතා පුළුල් විෂය පරාසයක් තුළ 5000කට අධික වූ පශ්චාත් උපාධිධාරීන් මේ දක්වා මෙම ආයතනය විසින් බිහි කර ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව විවිධ විෂය ධාරා හැදෑරූ උපාධිධාරීන්ගෙන් සමන්විත වෙයි.විවිධ රටවලින් පැමිණි විදේශීය උපාධිධාරීන් මේ වන විට ඔවුන්ගේ පශ්චාත් උපාධි, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී සම්පූර්ණ කර ඇති අතර තායිලන්තය, මාලදිවයින සහ ඇෆ්ගනිස්ථානය යන රටවලින් පැමිණිය ශිෂ්‍යයෝ වර්තමානයේ දී ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරමින් සිටිති. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම නිම්වළලු සමාජයේ පුළුල් පරාසයකට ව්‍යාප්ත කරමින් කොළඹ අග නගරයේ දී විද්‍යාපති උපාධි 04ක් ප්‍රදානය කරන පාඨමාලාවන් අති සාර්ථකව පවත්වාගෙන යනු ලබන්නේය. ඇතැම් පශ්චාත් උපාධි ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව පිරිනමනු ලබයි.

කොවිඩ් 19 වසංගතයත් සමගම, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තම ඉගැනුම් ක්‍රමවේදය මාර්ගගත ක්‍රමයට ලබාදීමටත් ඇගයීමටත් වෙනස්වූයේ අවශ්‍ය අනුමැතීන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ලබාගනිමිනි. පර්යේෂණ ආවරණ විභාගයන් ද මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කරන ලද්දේ ප්‍රමාදයන් වලක්වා ගනිමිනි. මෙහෙයින් නිසිකලට සිසුන්ට උපාධි සම්පූර්ණ කිරීමට හැකියාවන් ලැබිණි. වර්තමානයේ දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සියලුම අධ්‍යයන පාඨමාලා මාර්ගගත ක්‍රමයට ඉගැන්වීම එය ලද විශිෂ්ට ජයග්‍රහණයක් වන අතර අනාගතයේ දී නූතන තාක්ෂණික යටිතල සංවර්ධන උපාය මාර්ග හඳුන්වාදෙමින් ඉගැන්වීම් කරගෙන යාමට ආයතනය සැලසුම් කර ඇත.

**මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව**
**අධ්‍යක්ෂක**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| අ | හැඳින්වීම | 01 |
| ආ | ජයග්‍රහණ | 04 |
| ඇ | බාධක | 04 |
| ඇ | අනාගත සැලසුම් | 04 |
| ඉ | ජාත්‍යන්තරීකරණය | 21 |
| ඊ | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2021 වර්ෂයේදි ඉලක්ක ගත තිරසාර භාවයට අදාළ වැඩසටහන් | 21 |
| කෘෂිකර්ම විද්‍යා පුස්තකාල වාර්තාව | | 22 |
| මූල්‍ය ක්‍රියාකාරකම් | | 25 |
| ව්‍යවස්ථාපිත වාර්තාව සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම | | 29 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සහ විගණන පිළිතුරු. | | 60 |

# ආයතනයේ කළමනාකරණ මණ්ඩලය - 2021

## නිලබලයෙන් පත්වන ලද සාමාජිකයින්

1. මහාචාර්ය සී.එම්. බී .දෙමටවැව මයා, අධ්‍යක්ෂ,කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

2. ඩබ්. කේ. එල් .ඊ .වල්ලාවිට මයා, ප්‍රධාන මුල්‍ය නිලධාරි, උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා

3. එම්.ජේ.එම්. ඉෆ්හාම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය

4. බී. විජයරත්න මයා, ලේකම්, වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යංශය

5. ආචාර්ය ආර්.පී.එම්.පතිරණ, අතිරේක ලේකම් (පශුසම්පත් අංශය) ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යංශයේ ලේකම් වෙනුවට

6. කේ.ඒ.අයි.ඩී.සිල්වා මයා, අධ්‍යක්ෂක (ප්‍රතිපත්ති හා සැලසුම්) පරිසර අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කරමින්

7. අනුර සතුරුසිංහ මයා - වන සංරක්ෂණ ජෙනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්

8. ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන, ලේකම්, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

9. ආචාර්ය ඩබ්.එම්.ඩබ්.වීරකෝන්, අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

10. ආචාර්ය එන් වෙදසිංහ, අධ්‍යක්ෂ, ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

11. ආචාර්ය ඒ.පී. හීන්කෙන්ද ,අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

12.ආචාර්ය ඩී.එම්.එස්. මුණසිංහ, පීඨාධිපති, පශු වෛද්‍ය සහ සත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

13. මහාචාර්ය ඩී.කේ.එන්. ජී. පුෂ්පකුමාර, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

14. මහාචාර්ය කේ.එල්. වසන්ත කුමාර, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය

15. ආචාර්ය එම්. පී .එස් .මාගමගේ, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය

16 මහාචාර්ය ජේ. සි .එදිරිසිංහ, පීඨාධිපති,කෘෂිකර්ම පීඨය, වයඹ විශ්වවිද්‍යාලය

17. ආචාර්ය ඒ. එම් .ජේ .බී .අධිකාරි, පීඨාධිපති,කෘෂිකර්ම විද්‍යා පීඨය, රජරට විශ්වවිද්‍යාලය

18. ආචාර්ය එම්.පශ්තිනාදන්, පීඨාධිපති, කෘෂිකර්ම විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය

19. ආචාර්ය කේ .සූර්යකුමාර්, පීඨාධිපති ,කෘෂිකර්ම පීඨය යාපනය විශ්වවිද්‍යාලය

## කෘෂිකර්ම පීඨයෙන් තෝරාපත්කරණ ලද සාමාජිකයින්

20. මහාචාර්ය ඩී.සී.බණ්ඩාර මිය, කෘෂි ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

21.ආචාර්ය.එස්.පී.වැලිගමගේ, කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

22. මහාචාර්ය කේ. එස් .පී. අමරතුංග, කෘෂි ඉංජිනේරුවිද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

23. ආචාර්ය එල්.එන්.ඒ. සී. ජයවර්ධන, කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

24. මහාචාර්ය ජී .එල්. එල් .පී .සිල්වා මිය, සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය .

25. මහාචාර්ය බී .එම් .එල්. ඩී .බී .සූරියගොඩ, ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යන මණ්ඩල

26. මහාචාර්ය එස්. කොඩිතුවක්කු, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

27.ආචාර්ය ඩබ්.එම්.ටී.පී. ආරියරත්න, බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

28.මහාචාර්ය ඩී.සී.කේ.ඉලේපෙරුම මිය, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

29. මහාචාර්ය ඩී .එම් .ඩී . කොස්තා මිය, පැලෑටි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

30. ආචාර්ය ඩබ් .එස් .දන්දෙණිය මිය, පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයින්**

31. මහාචාර්ය එච්.පී.එම්.ගුණසේන, බෝග විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, විද්‍යා නිධි පේරාදෙණිය විශ්වවිද්‍යාලය

32. මහාචාර්ය සමන් අබේසිංහ, උද්භිද විද්‍යා අංශය, රුහුණු විශ්ව විද්‍යාලය

33. මහාචාර්ය එස්.කේ.පින්නවල සමාජවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

34. ආචාර්ය ජේ.එස්.බී.අබේසිංහ, අධ්‍යක්ෂක, තේ පර්යේෂණ ආයතනය

35. මහාචාර්ය එම්.බී.රණතිලක, ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# වගු

පිටුව


| | | |
|---|---|---|
| ආ .1 | සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු | 05 |
| ආ .2 | පශ්චාත් උපාධි පාඨමාලා හදාරන දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු | 05 |
| ආ .3 | උපාධි පාඨමාලාවල නියැලෙන විදේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු | 06 |
| ඇ | කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු | 07 |
| ඈ. 1 (අ) | යොමුකරන ලද සඟරාවල (සුචිගත හා සුචිගත නොකළ) ප්‍රකාශන ලේඛණය - 2021 | 08 |
| ඈ. 1 (ආ) | සුචිගත සඟරාවල පල කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා ලේඛණය - 2021 | 08 |
| ඈ .2 | 2021 වර්ෂයේදි ලද ජාතික හා අන්තර් ජාතික සම්මාන | 15 |
| ඈ .3 | 2021 වර්ෂයේ පොදු ජනතාවට දැනුම් සන්නිවේදනය කිරිම පිළිබඳ තොරතුරු | 18 |
| ඉ. 1 | පවත්වන ලද අන්තර්ජාතික සම්මන්ත්‍රණ සහ වැඩමුලු | 21 |
| ඉ .2 | 2021 වර්ෂයේ දී උපාධි අපේක්ෂක පාඨමාලා ඉගැන්වීම් පශ්චාත් උපාධි පාඨමාලා ඉගැන්වීම් පරිසංවාද වැඩමුලු සඳහා වූ ජාත්‍යන්තර කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු | 21 |

# වාර්ෂික වාර්තාව - 2021

## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## (2021 දෙසැම්බර් 31 දිනට)

### (අ) හැඳින්වීම

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1972 අංක 01 දරණ පැරණි ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ 1974 අංක 02 දරණ ව්‍යවස්ථාව මගින් 1975 වසරේ ජූනි මාසයේ දී ස්ථාපිත කොට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට යටත්ව ඉහත සඳහන් ව්‍යවස්ථා ආඥා පනතක් ලෙස සලකා කොමිෂන් සභාව විසින් 1979 අංක 9 දරණ පනත පැනවීමෙන් අනතුරුව එය 1980 ජනවාරි පළමු දින සිට ක්‍රියාත්මක තත්වයට පත් වී ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා නීතිමය පදනම සකස්කර දෙනු ලබයි. පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මෙරට තුළ ඉඩ ප්‍රස්ථාවන් සංවර්ධනය කිරීම හා මෙරට ශීඝ්‍රයෙන් පුළුල්වන කෘෂිකර්ම ක්ෂේත්‍රයට නිසි ලෙස පුහුණු කළ විද්‍යාත්මක පුද්ගලයන් දායාද කිරීම මෙම අද්විතිය ආයතනය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණු විය. මෙම ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පවතී.

### අධ්‍යයන වැඩසටහන්

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා වත්මන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්කමින් යුතු විවිධ උසස් උපාධි පාඨමාලාවන් සකස් කොට ඇත. රටේ ඉල්ලුමට උචිතවන පරිදි විෂයමාලාවන් ද සංශෝධනය කොට ඇති අතර වර්තමානය වන විට මෙම ආයතනය දර්ශණශූරී උපාධි ,ව්‍යාපාර පරිපාලන උපාධි සහා විද්‍යාපති උපාධි පාඨමාලාවන් 30 ක් පාඨමාලා කටයුතු සහ පර්යේෂණ ද ඇතුලත්ව පිරිනමනු ලබයි. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි උපාධි වැඩසටහන්වල දි පූර්ණ කාලින නේවාසික පුහුණුව කෙරෙහි වැඩි අවධානයක් යොමුකරයි. මෙතුළින් පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ විශ්ව විද්‍යාල අධ්‍යයන කාලය උපරිම වශයෙන් ප්‍රයෝජන ගැනීමට සහ පර්යේෂණ වැඩසටහන්වලට පූර්ණ වශයෙන් සහභාගිවීමට හැකිවනු ඇත. අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලට සැලකිය යුතු කාලයක් කැපකරන සහ අදාළ ක්ෂේත්‍රයන් වැඩි ප්‍රාගුණ්‍යයක් අත්කර ගැනීමට කැප වූ විනයගරුක සහ වෙහෙස වී කටයුතු කරන සිසුන් පිරිසක් බිහි කිරීමේ වැදගත් අභියෝගයට කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී සිටී. එවැනි කැපවීම් තුළින් ආයතනයේ උපාධිධාරීන් තුළ ඔවුන්ගේ චරිතවල අවියෝජනීය වූ කොටසක් බවට පත්වන ප්‍රබල කාර්ය ආචාරධර්ම සමුදායක් සංවර්ධනය කිරීම මෙම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා සුදුසුකම් ආකෘතික මාර්ගෝපදේශයන්ට සමාන වන ආකාරයෙන් මෙම ආයතනය දැනට පවතින රෙගුලාසි 2017 වසරේ සිට බලපැවැත් වන පරිදි සංශෝධනය කොට ඒ අනුව සිසුන් ඇතුළත් කරගන්නා ලදි. මෙම ආයතනය මගින් ප්‍රදානය කෙරෙන උපාධි වැඩ සටහන් වන්නේ,

- විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - සම්මාන පහක් ඉලක්ක කළ අධ්‍යයන/ව්‍යාපෘති පාඨමාලා වැඩ
- විද්‍යාපති/ව්‍යාපාර පරිපාලනපති - වසරක පර්යේෂණයක් ඇතුළත් පාඨමාලා වැඩ හා පර්යේෂණ
- දර්ශනපති / දර්ශණශූරී ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි

උක්ත විද්‍යාපති උපාධි සඳහා අදාළ සම්මාන අවශ්‍යතාවන් සපුරන අපේක්ෂකයින්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් උපාධි සහතික පත්‍ර මට්ටමමේ පාඨමාලා සම්පූර්ණ කල හැකිය. සම්මාන 25ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද සම්මාන20ක් ලබාගන්නා සිසුන්ට පශ්චාත් උපාධි සහතික පත්‍ර ද ලබාගත හැක. කෙටි කාලයකින් පශ්චාත් උපාධි සුදුසුකම අත්කරගැනීමට අවශ්‍ය කරන අපේක්ෂකයින් වෙනුවෙන් මෙම ආයතනය පශ්චාත් උපාධි සහතික පත්‍ර වැඩ සටහනක් හඳුන්වාදුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

## ආචාර්ය මණ්ඩලය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනෙය් අධ්‍යයන කාර්ය මණ්ඩලය පුළුල් ඉගැන්වීමේ හා පර්යේෂණ අත්දැකීම්වලින් සමන්විත 300 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පේරාදෙණිය කෘෂි විද්‍යා පීඨයට අයත්වන අතර ඉතිරි පිරිස විශ්වවිද්‍යාල පද්ධතියේ වෙනත් පීඨවලින් රජයේ දෙපාර්තමේන්තු, පර්යේෂණ ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත්වේ.

අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ සිසුන් 205 දෙනෙකු 2021 වසරේ දි ලියාපදිංචි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

විද්‍යාපති - 152 ව්‍යාපාර පරිපාලනපති - 29 දර්ශනපති - 16 දර්ශනශූරි - 04 අනියම් - 04

2021 වසරේ දි උපාධි ප්‍රදානෝත්සවයේදි සිසුන්ට උපාධි පිරිනමන ආකාරය පහත පරිදිය.

දර්ශනශූරි -07 දර්ශනපති- 04 විද්‍යාපති -58 ව්‍යාපාර පරිපාලනපති - 13

පශ්චාත් උපාධි ඩිප්ලෝමා-13 ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ) – 01

විද්‍යාපති (පාඨමාලා සහ පර්යේෂණ) - 09

## වාර්ෂික සම්මේලනය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනෙය් 33 වැනි වාර්ෂික සම්මේලනය 2021 නොවැම්බර් 17 යන දින පවත්වන ලදි. කෘෂිකර්ම ජීව තාක්ෂණික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක කථිකාචාර්ය, මහාචාර්ය පි.සී.ජී.බණ්ඩාරණායක මිය මෙහි සම්බන්ධීකාරක ලෙස කටයුතු කළාය.

මෙම සම්මේලනයේ ආරම්භක සැසිය එහි සුවිශේෂිත ආරාධිතයන් වූ විශ්ව විද්‍යාලයේ උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපතිවරුන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් නියෝජිත, විමලේන්ද්‍ර ෂාරන් මහතා සහ ප්‍රධාන දේශක වශයෙන් ඇමරිකාවේ ජෝන්ස් හොප්කින්ස් නිට්සේ උසස් අන්තර්ජාතික අධ්‍යයන විද්‍යාලයේ මහාචාර්ය ජෙසිකා ප්‍රාන්සෝ මහත්මියගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි,

දේශීය හා ඉන්දියාව ඇතුළු විදේශීය ආයතනවල පර්යේෂණ සිසුන්ගෙන් පර්යේෂණ පත්‍රිකා 56 ක් ලැබිණි. සමාලෝචනයෙන් පසුව, වාචික ඉදිරිපත් කිරීම් 30 ක් තාක්ෂණික සැසි 05 ක් යටතේ ඉදිරිපත් කළ අතර පෝස්ටර් 21 ක් ඉදිරිපත් කරන ලදි. ඒ අතරින් වඩාත් විශිෂ්ඨ වූ ඉදිරිපත් කිරීම වෙනුවෙන් සම්මාන 15 ක් ප්‍රදානය කරන ලදි.

# ආයතනික ව්‍යුහය




**කෙටි යෙදුම්:**

SAB – ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

SAL- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිනය

SA/P – පද්ධති විශ්ලේෂක

AR – සහකාර ලේඛකාධිකාරී

***අධ්‍යයන මණ්ඩල**

කෘෂිකාර්මික ජීවවිද්‍යාව
කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව
කෘෂිකාර්මික ඉංජිනේරුකරණය
කෘෂිකාර්මික ව්‍යාප්තිය
සත්ව විද්‍යාව
ව්‍යාපාර පරිපාලනය
ජීව විද්‍යා සංඛ්‍යානය
බෝග විද්‍යාව
ආහාර විද්‍යාව හා තාක්ෂණය
පැලෑටි ආරක්ෂණය
පාංශු විද්‍යාව

## (ආ ) ජයග්‍රහණ

ආචාර්ය ඒ.ඩබ්.ආර්. ජෝකිම් අනුස්මරණ ත්‍යාග ප්‍රදානය 2001 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එය අවසන් වසර අවබෝධතා පරීක්ෂණයේදී සාර්ථකව මුහුණ දෙන ඉහළම GAP අගයක් ලබාගන්නා ප්‍රශංසනීය ශිෂ්‍යයාට ප්‍රදානය කරන්නකි. 2021 වර්ෂයේ නොවැම්බර් 17 වැනි දින පැවති 33 වැනි වාර්ෂික සමුළුවේදී තම උපාධි පාඨමාලාවේ ඉහළම GAP අගය 4.00 ක් ලබාගත් පහත සඳහන් සිසුවියට මුදල් ත්‍යාගය පිරිනමන ලදී.

| නම | අධ්‍යයන මණ්ඩලය | උපාධි පාඨමාලාව |
|---|---|---|
| ආර්.ඒ.ටී.එන්. රණසිංහ (ලියාපදිංචි අංකය 18121) | කෘෂිකාර්මික ඉංජිනේරු | කෘෂිකාර්මික හා ජීව පද්ධති ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව |

## (ඇ) බාධක

සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කල්දැමීමට සිදුවූයේ කොවිඩ් වසංගත තත්වය මත අධ්‍යයන කටයුතු අතත්‍ය ක්‍රමයට පරිවර්තනය කිරීමේදී අවශ්‍ය වන මාර්ගගත පහසුකම් හා තාක්ෂණ දියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමුකිරීමට සිදුවූ බැවිනි. තවද සිසුන්ගේ පර්යේෂණ කටයුතු නිමකිරීමට බාධා පැමිණි අතර එය උපාධිධාරී නිමැවුම කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කළේය.

## (ඈ) අනාගත සැලසුම්

1. ආයතනයේ වෙබ් අඩවිය නිරන්තර යාවත්කාලීන කිරීම තුළින් දෘෂ්‍යතාවය වර්ධනය කිරීම සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුවත්පත් ලිපි/ කාලීන ප්‍රකාශන නියමිත කාල පරාසය තුල ප්‍රකාශනය කිරීම හා සාමාන්‍ය සහ විද්‍යුත් මාධ්‍ය හරහා ඒවා බෙදා හැරීම තුළින් සියළුම පාඨමාලා සඳහා වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ දැමීම.

2. පර්යේෂණ කෘති කොපිකිරීම හඳුනාගන්නා මෘදුකාංග පහසුකම්, උඩුගත කළ වීඩියෝ සමඟින් ඉගැන්වීම් හා ප්‍රතිඵලදායක ඉගෙනුම් පහසුකම් සහිත නවීන උපාංග සහිත ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් දියුණු කිරීම

3. පශ්චාත් උපාධි හදාරන සිසුන්ගේ ඉගැන්වීම් හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම, අධ්‍යයන පාඨමාලා සංවර්ධනය සහ ඇගයීම් කටයුතු ද නායකත්ව දියුණුව සඳහා අදාළ වන කෙටිකාලීන පුහුණු වැඩමුළු ලබාදීම වැනි කටයුතු සඳහා දේශීය හා විදේශීය වෘත්තිකයන්ගේ සහය ලබා ගැනීම

4. සුවිගත විද්‍යාත්මක සඟරාවල පළ කරගැනීමේ හැකියාව පුළුල් කරගැනීමටත්, දේශීය පළකිරීම් හැකියාව ශක්තිමත් කරගැනීමටත් පොදු ජනතාව උදෙසා තම පර්යේෂණ ඵල දැනුවත් කිරීමටත් පශ්චාත් උපාධි හදාරන සිසුන්ට පහසුකම් සැලසීම.

5. තාක්ෂණික පහසුකම් සැපයීම සහ වැඩිදියුණු කරගැනීම මඟින් විදේශ විද්‍යාලවල අධ්‍යයන මණ්ඩල පර්යේෂණ මධ්‍යස්ථානවල සහ කර්මාන්තයේ වෘත්තිකයන්ගේ සේවය ලබාගැනීමට කටයුතු යෙදීම.

6. කෘෂිකර්ම විද්‍යා පුස්තකාල සම්පත් ඩිජිටල්කරණය කිරීම.

7. පශ්චාත් උපාධිය හදාරන සිසුන්ගේ සහ ඔවුන්ගේ අධීක්ෂකයන්ගේ විශිෂ්ඨ වූ පර්යේෂණ ව්‍යාපෘති මඟින් ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ පේටන්ට් බලපත්‍ර ලබාගැනීම සඳහාත් බලපෑම කළ හැකි පර්යේෂණ කෘතීන් එළි දැක්වීම වෙනුවෙනුත් ඇගයීම.

8. නවතම සංවර්ධිත පන්ති කාමර සහ උසස් ගණයේ පර්යේෂණ කිරීම සඳහා විද්‍යාගාර පහසුකම් සැලසීම, බාහිර කාර්යමණ්ඩල සහ විදේශීය සිසුන් වෙනුවෙන් නවාතැන් පහසුකම් සහ විවේක ගැනීම් පහසුකම් සලසා දීම මූලික කොට ගත් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

9. කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමටත් ආයතනයේ දිගුකාලීන තිරසාර සංවර්ධනය උදෙසාත් මූල්‍ය කළමණාකරණය, පාරිසරික දැනුවත්භාවය ආදිය මත සේවකයින් සඳහා වැඩමුළු සංවිධානය කිරීම

ආ) ශිෂ්‍ය බඳවා ගැනීම්

## ආ.1 ) 2021 දෙසැම්බර් 31 වැනි දිනට සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

| අධ්‍යයන පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්ය මණ්ඩල ව්‍යාප්තිය (ස්ථිර කාර්ය මණ්ඩලය පමණි) | | | |
|---|---|---|---|---|---|
| | | අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය | මුළු ගණන |
| අනියම් | 04 | 2 | 37 | 1 | 40 |
| දර්ශනපති (පාඨමාලා හා පර්යේෂණ) | 87 | | | | |
| විද්‍යාපති (පාඨමාලා) | 1123 | | | | |
| විද්‍යාපති (පාඨමාලා හා පර්යේෂණ) | 239 | | | | |
| ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා) | 157 | | | | |
| ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ) | 68 | | | | |
| දර්ශනශූරී | 103 | | | | |
| මුළු ගණන | **1791** | **2** | **37** | **1** | **40** |

## ආ.2) 2021 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

| අධ්‍යයන පාඨමාලාව | පූර්ණකාලීන/ අර්ධ කාලීන | නවක බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2021) | | | ශිෂ්‍ය බඳවා ගැනීම (2021 දෙසැම්බර් දිනට ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව) | | | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | මුළු ගණන | පිරිමි | ගැහැණු | මුළු ගණන | |
| අනියම් | අර්ධ කාලීන | 1 | 3 | 4 | 1 | 3 | 4 | |
| දර්ශනපති (පාඨමාලා හා පර්යේෂණ) | පූර්ණ කාලීන | | | | | | | |
| දර්ශනපති (පර්යේෂණ) | පූර්ණ කාලීන | 2 | 14 | 16 | 28 | 69 | 97 | 4 |
| විද්‍යාපති (පාඨමාලා) | පූර්ණ කාලීන | 1 | 3 | 4 | 59 | 180 | 239 | 58 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යාපති (පාඨමාලා සහ පර්යේෂණ) | පූර්ණ කාලීන | 41 | 107 | 148 | 352 | 771 | 1123 | 9 |
| ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා) | පූර්ණ කාලීන | 12 | 13 | 25 | 86 | 71 | 157 | 13 |
| ව්‍යාපාර පරිපාලනපති (පාඨමාලා සහ පර්යේෂණ) | පූර්ණ කාලීන | 0 | 4 | 4 | 37 | 31 | 68 | 1 |
| දර්ශනශූරි (පාඨමාලා හා පර්යේෂණ) | පූර්ණ කාලීන | | | | | | | |
| දර්ශනශූරි (පර්යේෂණ) | පූර්ණ කාලීන | 2 | 2 | 4 | 45 | 54 | 99 | 7 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | පූර්ණ කාලීන | 0 | | | | | | 13 |
| **මුළු එකතුව** | | **59** | **146** | **205** | **508** | **1179** | **1787** | **105** |

**ආ.3) 2021 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ විදේශීය සිසුන් පිළිබඳ**

| අධ්‍යයන පාඨමාලාව | පූර්ණකාලීන/ අර්ධ කාලීන | නවක බඳවා ගැනීම් (ජනවාරි - දෙසැම්බර් 2021) | | | ශිෂ්‍ය බඳවා ගැනීම (2021 දෙසැම්බර් දිනට ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව) | | |
|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | මුළු ගණන | පිරිමි | ගැහැණු | මුළු ගණන |
| දර්ශනශූරි | පූර්ණ කාලීන | | | | | 4 | 4 |
| මුළු එකතුව | | | | | | 4 | 4 |

(ඇ) කාර්ය මණ්ඩල තොරතුරු

| සේවා වර්ගය | වැටුප් කේතය | 2017.12.31 දිනට අනුමත | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| **ප්‍රාථමික මට්ටම** | | 17 | |
| ප්‍රාථමික ශ්‍රේණිය - දක්ෂතා නැති | PL-1 | | 5 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ දක්ෂතා | PL-2 | | 4 |
| ප්‍රාථමික ශ්‍රේණිය - දක්ෂතා | PL-3 | | 6 |
| | | | |
| **ද්විතියික මට්ටම** | | 21 | |
| කළමණාකාර සහකාර - තාක්ෂණික නොවන | U-MN 1 | | 15 |
| කළමණාකාර සහකාර - තාක්ෂණික | U-MT 1 | | - |
| ආශ්‍රිත නිළධාරි - 2 වැනි කාණ්ඩය | U-MN 2 | | - |
| ආශ්‍රිත නිළධාරි - 1 වැනි කාණ්ඩය | U-MN 3 | | - |
| මාණ්ඩලික සහකාර / සුප්‍රා සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | U-MN 4 | | 6 |
| | | | |
| **තෘතිය මට්ටම** | | 2 | |
| අධ්‍යයන සහකාර - 2 වැනි කාණ්ඩය | U-AS 1 | | - |
| කණිෂ්ඨ විධායක/ කළමණාකරු | U-EX 1 | | 1 |
| අධ්‍යයන සහකාර | U-AS 2 | | 1 |
| | | | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | 11 | |
| වෛද්‍ය නිළධාරි | U-MO 1 | | |
| ප්‍රධාන වෛද්‍ය නිළධාරි | U-MO 2 | | |
| මධ්‍යම මට්ටමේ විධායක නිළධාරින් | U-EX 2 | | 1 |
| මධ්‍යම මට්ටමේ විධායක නිළධාරින් | U-EX 2 (a) | | 1 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිළධාරින් | U-EX 3 | | |
| කථිකාචාර්ය | U-AC 3 | | 8 |
| ආශ්‍රිත මහාචාර්ය | U-AC 4 | | - |
| මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 | | 1 |

(ඈ) පර්යේෂණ නිමවුම් දත්ත

ඈ. 1 2021 වර්ෂයේ ප්‍රකාශක නිමවුම්

ඈ.1.(අ) 2021 දී යොමුකරන ලද (සුවිගත සහ සුවිගත නොකළ) සඟරාවල ප්‍රකාශන ලැයිස්තුව

| පියය | ප්‍රකාශන වර්ගය | | සංඛ්‍යාව | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| | | | ප්‍රකාශිත දේශීය | ප්‍රකාශිත විදේශීය | |
| | සුවිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව | | 6 | 20 | |
| | සුවිගත නොකරන ලද සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව | | 8 | | |
| | යොමු නොකළ සඟරාවල පළ කරන ලද සම්පූර්ණ පර්යේෂණ වාර්තා සංඛ්‍යාව | | | | |
| | සමුළු ලේඛනවල සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා වශයෙන් පළ කරන ලද සමුළු පර්යේෂණ සංඛ්‍යාව | | | 2 | |
| | සංක්ෂිප්ත පළකිරීමේ සංඛ්‍යාව | | | 2 | |
| | පුස්තක ඡේද පළකිරීමේ සංඛ්‍යාව | | 1 | 4 | |
| | ප්‍රකාශිත පොත් ගණන | ප්‍රකාශක විසින් | | | |
| | | කතෘ විසින් | | | |

ඈ.1 (ආ) සුවිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ වර්තා - 2021

සමාලෝචිත වර්ෂයේදි, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් විසින් පහත සඳහන් ප්‍රකාශනයන් Tropical Agricultural Research සඟරාවේ පළ කරන ලදි. මෙම සඟරාව 1989 පටන් ආයතනය විසින්ම පළ කරන සඟරාවකි.

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
|---|---|---|
| උසස් තත්වයෙන් යුතු සෞඛ්‍යාරක්ෂිත ආහාර පිසගැනීමට දෙල්පිටි එක් කර ගැනීම | එල්.ආර්. ඉශේරා | ටී.මහේන්ද්‍රන් සහ එම්.ආර්. රෝෂන |
| නව යොවුන් වියේ පාසල් දරවන්ගේ ශාරීරික කියාකාරකම් හා පෝෂනීය තත්වය කෙරෙහි කඩචෝරු පරිභෝජනයේ බලපෑම- ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කය පදනම් වූ අධ්‍යනයකි | යු.එල්. එන්.එස්. ඒකනායක | ඩී.පී.එන්.පී. විජේසිංහ |

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
|---|---|---|
| වර්ධනයේදී ඵලවළ බෝග ඇමෝනියම්-එන් සහ නයිට්‍රේට-එන් වෙනස් අනුපාතයන්ගෙන් ලබා ගනී | කේ.කේ.කේ. නවරත්න | ඩබ්ලිව්.එස්.දන්දෙනිය, ආර්.එස්.ධර්මකීර්ති, පි.වීරසිංහ |
| ජල පහසුව,බෝග තේරීම සහ ගොවිතැනේ ලාභදායකත්වය. මහ කණුමුල්ල වැව් ගම්මානය පදනම් අධ්‍යනයකි | ඩී.දයානන්ද | ජේ.වීරහේවා, එස්.ඒ.වීරසූරිය |
| ශ්‍රී ලංකාවේ වැවෙන තෝරාගත් ඌන උපයෝජන පළතුරු පොහොර වල ප්‍රතිඔක්සිකාරක කාර්යක්ෂමතාව | එම්.ඒ.එල්.එන්. මල්ලවආරච්චි | ටී.මදූෂිත්, එල්.ඩී.බී.සූරියගොඩ, ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර |
| ශ්‍රී ලංකාවේ පොල් වගාවේ නිෂ්පාදන සාධක සහ සමස්ත සාධක ඵලදායකත්වයේ ප්‍රතිඵලය | එම්.ජී.ඩී.අබේසේකර | ඩී.වී.පී.ප්‍රසාද |
| සාමාන්‍යකරණීය රේඛීය මිශ්‍ර ආකෘති නිර්මාණය සහ සාමාන්‍යකරණීය අවගමන මධ්‍යස්ථ පද්ධති ක්‍රියාකාරකම් සැසදීම සඳහා වූ අනුකරණ අධ්‍යයනය. | ජේ.සී.හපුගොඩ | එම්.ආර්.සූරියආරච්චි |
| දේශීය සහ විදේශීය ළළදෙන්නු සාදන ලද යොගට්වල ප්‍රොබියෝටික් ශක්‍යතාවය සහ භෞතික රසායනික ගුණාංග | ඩබ්ලිව්.වී.වී.ආර්. වීරසිංහ | සී.එස්. රනධීර, පී.එච්.පී ප්‍රසන්න, ජී.එල්.එල්.පී සිල්වා, ජේ.කේ. විදානාරච්චි |
| ශ්‍රී ලංකාවේ මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවලින් වාර්තා වූ අස්වනු නෙලීමට පෙර කැවෙන්ඩිෂ් කෙසෙල්වල ඇඟිලි කුණුවීම හේතුකාරකයේ . ව්‍යාධිජනක බව හඳුනාගැනීම සහ තහවුරු කිරීම | ඩබ්ලිව්.එම්.පී. කල්පනී | ඩබ්ලිව්.එම් ද කොස්තා, ටී.ආර්. හපුතන්ත්‍රි |
| බොයිලර් කුකුල්මස් වල ජෛව පටල සෑදීමේ හැකියාව ආහාර මතුපිට ඇතිවල සැල්මොනැල්ලා , .විශේෂිතය | ටී.එස්.පී. ජයවීර | එච්.ඒ.ඩී. රුවන්දීපිකා, වී.කේ දීක්ෂිත්, එස්.පී. කොඩිතුවක්කු, එච්.ඩබ්ලිව් සිරිල්, අයි. කරුණාසාගර්, ජේ.කේ විදානාරච්චි |
| වියන් පත්‍ර ප්‍රදේශ දර්ශකය සහ ශ්‍රී ලංකාවේ නිවර්තන වැසි වනාන්තරවල වාස්තු විද්‍යාව පිළිබඳ ප්‍රතිචාරය | ආර්.එම්.සී. මධුමාලි | ඩබ්ලිව්.එම්.පී.එස්.බී.වාහල, එච්.කේ. සංජීවනී, ඩී.පී. සමරසිංහ, ඩබ්ලිව්.ඒ.ජේ.එම් ද කොස්තා |
| ශ්‍රී ලංකාවේ අඹ,අන්නාසි සහ දිවුල් වාණිජ භෝගවල ජෛව ක්‍රියාකාරී සෞඛ්‍ය ප්‍රවර්ධන සංයෝගවල උන්නතාංශය | පී.සී. අරම්පත් | මැතිජ්ස් ඩෙකර්, ඩී.ඒ.එන්. ධර්මසේන |

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයේ වනාන්තරයෙන් පිටත නිදහස් සම්පතක් ලෙස ගෙවතු වශයෙන් කෙරෙන ඉඩම් පරිභෝජනයේ අවකාශීය සහ තාවකාලික වෙනස්කම්-ජෛව,භෞතික සහ සමාජ ආර්ථික නිර්ණායකගේ ප්‍රධාන වෙනස්වීම් | එච්.එම්.බී.එස්. හේරත් | ඩී.කේ.එන්.ජී.පුෂ්පකුමාර, එම්. හෙවිසන්, පී. වික්‍රමගමගේ |
| ශ්‍රී ලංකාවේ වික්ටෝරියා ජලාශයෙන් ඇමසන් Sailfin Catfish වෙතින් ලබාගන්නා මාළු ප්‍රොටීන්වල ජෛව ක්‍රියාකාරී ගුණයන් | එස්.කේ.ඩී. විජේසිංහ | ටී.ඩී.එන්.එස්. අබේරත්න, ජේ.කේ.විදානාරච්චි, ආර්.පී.එන්.පී. රාජපක්ෂ |
| ශ්‍රී ලංකාවේ තෝරාගත් ඌන උපයෝජන පළතුරුවල ෆිනෝලික් සංයෝග සහ ප්‍රතිඔක්සිකාරක ධාරිතාවය පිළිබඳ ආමාශ ආන්ත්‍රික ජීර්ණය සහ ඩයලිසිස් ක්‍රියාවලිය | එච්.ඒ.සී.ඕ. හෙට්ටිආරච්චි | කේ.ඩී.පී.පී. ගුණතිලක, එස් ජයතිලක |
| කුකර්බිටා මැක්සිමා සහ කුකර්බිටා මොස්චාටා විශේෂිත වට්ටක්කා බීජ පිටිවල භෞතික රසායනික සහ ක්‍රියාකාරී ගුණාංග | එච්.එම්.අයි.ඒ. උඩුවෙරැල්ල | පී.සී. අරම්පත්, ඩී.සී. මුදන්නායක |
| වගාව සැලසුම සහ කළමණාකරණය කිරීමට වර්ෂාපතනයේ පූර්ව හඳුනාගැනීම-ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය වසමෙහි කෘතිම පද්ධති භාවිතයෙන් කරන ලද පුරෝකථන ආකෘතියකි | එන්.එම්. හක්මනගේ | එන්.වී. චන්ද්‍රසේකර, ඩී.ඩී.එම්.ජයසුන්දර |
| ආර්ථික වශයෙන් වැදගත් වන දිශාභිමුඛ අභිජනනය සඳහා මාපිය වශයෙන් තෝරාගැනීමට සංරක්ෂණය කරන ලද උක්වල ඇති ගති ලක්ෂණ | බී කිරිවත්තුඩුව | ඒ.විජේසූරිය, ටී.ඩී.සිල්වා, එස්.ඩබ්ලිව්.රන්වල, ඩබ්ලිව්.විජේසූරිය |
| යූරියා ලබාදීම අඩුකිරීම. නිෂ්පාදනය සහ ඇල්ෆිසොල් එකක ඇති සහල් සහ නයිට්‍රජන් කොටස්වල වර්ධනයට වන බලපෑම ඇගයීම | එම්.කේ.එන්.ඩබ්ලිව්. ජයරත්න | ආර්.එස්. ධර්මකීර්ති, ඩබ්ලිව්.එම්.යූ.කේ. රත්නායක |
| ශ්‍රී ලාංකික වගා ගොවියන් විසින් කාලගුණික තොරතුරු භාවිතය : සැලසුම් කරන ලද හැසිරීම් න්‍යාය භාවිතයෙන් | එන්.එම්.කේ.සී. ප්‍රේමරත්න | ඒ. සෙනරත්න, එල්.එච්.පී. ගුණරත්න |

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
|---|---|---|
| කෙසෙල් සහ දෙහි ලෙලිවල ඇති ප්‍රතිඔක්සිකාරක සහ ප්‍රති ක්ෂුද්‍ර ජීව ගුණ පිළිබඳ සංසදානාත්මක විශ්ලේෂණය | ඩී.එම්.සී.පී.දවුන්දසේකර | ආර්.පී.එන්.පී. රාජපක්ෂ |
| කෘෂිකර්ම ව්‍යාප්ති දැනුමැති පුද්ගලයන්ගේ අදහස් මත තේ අංශයේ ගොවි සංවිධාන සඳහා වන ඇගයීම් රාමුවක් සංවර්ධනය කිරීම | කේ.ජී.ජේ.පී. මහින්දපාල | එම්.ඩබ්ලිව්.ඒ.පී. ජයතිලක, එල්.එන්.ඒ.සී. ජයවර්ධන, ටී. සිවනන්දවේල් |
| පැළෑටි වලින් නිපදවන අගුරු සහ දෙහි දූෂක පසෙහි ඇති ඝන ලෝහ වන Pb සහ Cd මත කෙරෙන බලපෑම | ආර්.එම්.බෝරෝ | එන්.බරුආ, එන්. ගොගොයි |
| දිලීරනාශක මඟින් ක්‍රියාකාරිභාවය හීන කිරීම | සී. කොඩිතුවක්කු | වයි.ජී.එම්. ප්‍රසාදනී, එම්.පී.බී. විජයගුණවර්ධන, සී. රත්නායක, කේ.එෆ්. ලී, එස්.පී.කොඩිතුවක්කු |
| වැලි සහිත වයනය සහිත පොල් වැඩෙන පසක ඇති ලෝහ පිළිබඳව කෙරෙන සෝර්ප්සන් සමස්ථානික විශ්ලේෂණය | එම්.කේ.එෆ්. නදීෂා | ඒ.ජේ. මොහොට්ටි, එන්.ප්‍රියන්ත |
| සමස්ත වර්ෂාපතන දර්ශකය (SPI) භාවිතයෙන් නියඟ විශ්ලේෂණය - ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයේ සිද්ධි අධ්‍යනයකි | ටී. සෙල්ලතුරෙයි | කේ.වෙනුගෝබන්, එස්.එස්.ශිවකුමාර්, ටී.මිකුන්තන් |
| ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ විවිධ යෙදවුම් පද්ධති යටතේ ඍජු බීජ සහිත සහල්වල ප්‍රමාණය සහ භෝග අස්වැන්න වර්ධනය | ඩබ්ලිව්.එම්.ඩී.එම්.වික්‍රමසිංහ | ඩී.ඒ.යූ.ඩී. දේවසිංහ, ඩී.එම්.ඩී දිසානායක, ඩී.අයි.ඩී.එස්. බෙනරගම, ඩබ්ලිව්.සී.පී. එගොඩවත්ත, එල්.ඩී.එම්. බී.සූරියගොඩ |
| බිත්තර සාර භාවිත කරමින් මුල ගැට නෙමටෝඩයේ අණුක හඳුනා ගැනීම සඳහා DNA නිස්සාරණ ප්‍රොටෝකෝල සංසන්දනය කිරීම | ඩබ්ලිව්. එම්. එස්. යූ.කේ. විජේකෝන් | කේ.එම්.ඩී.ඩබ්ලිව්.පී. නිශාන්ත, ඩී.එම් ද කොස්තා |
| තත්කාලීන ඩිජිටල් දැනුම පදනම් කරගත් පද්ධතියක් තුළින් අල නිෂ්පාදනයේ අභියෝග ජයගැනීම සහ තිරසාර බව ළඟාකර ගැනීම | එම්.එස්.ඒ. මොහොමඩ් | ඩී.එල්.වතුගල, ඩබ්ලිව්.ඒ. ඉන්දික, එම්.කේ.එස්.මධුෂිකා |
| වැව් කැස්කඩ් පද්ධතිවල ජල ඵලදායිත්වය: ශ්‍රී ලංකාවේ මහකණුමුල්ල කැස්කේඩයේ සිද්ධි අධ්‍යනයකි | එස්. සිරිමාන්න | ඩී.වී.පී. ප්‍රසාද |

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට, දෙවනි අන්තර් මෝසම් වර්ෂා පතනයෙන් ඉන්දියන් සාගරයේ ඇතිවන සිදුවීම්වල බලපෑම | ඒ.බී.අබේසේකර | බී.වී.ආර්. පුණ්‍යවර්ධන, බී.මාරඹේ, අයි.එම්.එස්.පී. ජයවර්ධන, ටී.ශිවනන්තවෙල්, වී.එන්.එම්.වික්‍රමසිංහ |
| ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රධාන කෘෂිකර්මික ප්‍රදේශයක වර්ෂාපතන විචලතාවය තක්සේරු කිරීම සඳහා සමස්ත වර්ෂාපතනය දර්ශකය යෙදීම | ඊ.එම්.ජී.පී. හේමචන්ද්‍ර | එන්.ඩී.කේ.දයාවංශ, ආර්.පී ද සිල්වා |
| ශ්‍රී ලංකාවේ වී ඒක වගාව සහ වී සහ බඩඉරිඟු වැවීම පිළිබඳ භෝග මාරු ක්‍රමය යන ගොවිතැන් පිළිබඳ තිරසාර බව ඇගයීමේ සංසන්දනාත්මක විශ්ලේෂණය | එස්.පී. දිසානායක | එල්.එච්.පී. ගුණරත්න, ටී. ශවනතෙවර්, ජී.ඒ.එස් ගිනිගද්දර |
| ශ්‍රී ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග සහල් ගොවිතැනක බලශක්ති කාර්යක්ෂමතාවය සහ ආර්ථික විශ්ලේෂණය 2018/2019 මහ කන්නය පිළිබඳ ඇගයීමකි | එන්.ඒ.ආර්. ජේ.පෙරේරා | ඒ.කේ.කරුණාරත්න, බී.එල්.ඒ.බස්නායක |
| පැපොල්, කොමඩු පළතුරු අපද්‍රව්‍ය සහ කෙසෙල් තනි සෛල ප්‍රෝටීන් නිෂ්පාදනයක් බවට පරිවර්තනය කිරීම | පී. තිවියා | ආර්.කපිලන්, ටී. මධුජිත් |
| දකුණු ආසියාවේ කෑමට ගත හැකි තෙල් නිෂ්පාදනයේ සන්සන්දනාත්මක වාසිය: ප්‍රතිපත්ති විශ්ලේෂණ දර්ශකයක් භාවිතයෙන් වන ඇගයීම | එස්. සාහිබ්සඩා | ඩී. හේමචන්ද්‍ර, එස්.ඒ. විජේසූරිය, ජේ. වීරහේවා |
| ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ වාණිජමය වශයෙන් ලබාගත හැකි තෝරාගත් ආහාරවල ට්‍රාන්ස් මේද අන්තර්ගතය පිළිබඳ අධ්‍යනය | එම්.එල්.ඩී. වාසනා | ඒ.ද සිල්වා, එන්. ගුණවර්ධන, ඩී.සී.කේ. ඉල්ලප්පෙරුම, ඩබ්ලිව්.එම්.පී. බී වීරසිංහ, ඩබ්ලිව්. එම්.ඩී.සී. වීරතුංග, එස්. ඒකනායක, ටී. මධුජිත් |
| උෂ්ණත්ව හා තෙතමනය සහිත හරිතාගාර තත්ත්වයන් යටතේ පාංශු රහිත තත්ත්වයක වගාකරන ලද තක්කාලි සඳහා පොටෑසියම් යෙදුම් අනුපාත | එච්.ආර්.යූ.ටී.එරබදුපිටිය | ඩබ්ලිව්.ඒ.පී. වීරක්කොඩි, කේ.ඒ.නන්දසේන |
| ඉඩ්ලි බැටරයෙන් හුදකලා වූ ලැක්ටික් අම්ල බැක්ටීරියාවල ලක්ෂණ සහ ඒවායේ ප්‍රතිජීවකවලට ඇති සංවේදිතාවය | ඩී. බර්නාර්ඩ් | එන්.ජෙයගොව්රි, ටී. මධුජිත් |

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
| --- | --- | --- |
| ශ්‍රී ලංකාවේ කල්මුනේ ප්‍රදේශයේ වැඩි දියුණු කළ ඝන අපද්‍රව්‍ය එකතුවෙන් ඇති කිරීමේ හැකියාව තක්සේරු කිරීම- ගෙවීමක් කිරීමට ඇති කැමැත්ත පිළිබඳව විශ්ලේෂනයකි | ඒ.දිල්සාන් | ඩී.වී.පී.ප්‍රසාද |
| ශ්‍රී ලංකාවේ කුන්ඩසාලේ කෘතිම සංවන මධ්‍යස්ථානයේ සිටින ඩොනර් ගවයන්ගේ ශුක්‍රාණුවල ගුණාත්මකභාවය ඇගයීම | ඩබ්ලිව්.ඩබ්ලිව්.අබේගුණවර්ධන | පී.ජී.ඒ. පුෂ්පකුමාර, එච්.එම්.එස්.වාසනා, ඩබ්ලිව්.එම්.ටී.ඩීරත්නකුමාර, බී.අලෙක්සැන්ඩ්‍රා |
| ජල හිඟයේ බලපෑම මත හුරු වූ ශ්‍රී ලංකාවේ හොරිවිල, පලුගස්වැව සහ සියවලාකුලම කඳුකරයේ ගොවි ප්‍රජාවගේ ජීවනෝපාය සහ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ උපාය මාර්ග | එම්.එම්.ජී.එස්.දිලිනි | ඊ.ආර්.එන්. ගුණවර්ධන, එස්.පත්මරාජ |
| වී පසෙන් DNA නිස්සාරණය කිරීමට විභව ප්‍රොටෝකෝල කීපයක් ඇගයීම | ටී.ඩී.රණසිංහ | ඩී.එම් ද කොස්තා, ආර්.එස් ධර්මකීර්ති |
| තීරු බදු කප්පාදුව සහ කෘෂිකර්මාන්තයේ ඵලදායිත්වය නිසා ආර්ථිකයට වන පුළුල් බලපෑම: ශ්‍රී ලංකාවේ ගණනය කළ හැකි සාමාන්‍ය සමතුලිත විශ්ලේෂණය | සී.ස්වර්ණතිලක | එස්.ඒ.වීරසූරිය |
| ග්ලැඩියස් ශාකයේ අල සහ කුඩා එල නිශ්පාදනය වගාවේදී තබන දුරස්ථභාවය සහ අලෙහි පමානය මගින් වර්ධනය වීම | එන්.ජේ. මෙකලා | එම්.එස්.ඉස්ලාම |
| පොසපරස් ඌණතා තත්ත්වයකදී තෝරාගත් රනිල කුලයට අයත් භෝගවල පොස්පරස් බලමුළු ගැන්වීමේ ධාරිතාවය | ටී.ජී.ආර්.එම්. තෙන්නෙගෙදර | ඩී.එම්.එස්.බී. දිසානායක |
| කොවිඩ් 19 වසංගත කාලයේදී ශ්‍රී ලංකාවේ එළවළු වෙළඳපලේ අවකාශිය අනුකලනය | ඩී.එම්.එන්.ජේ. කුමාරි | ජේ.වීරහේවා, ඩී.හේමචන්ද්‍ර |
| විචලෝයය් බහුවිධ විශ්ලේෂණ (MANOVA) සහ පසුවිපරම් කැනොනිකල් විචල්‍ය විශ්ලේෂණ භාවිත කරන සංවේදක පැතිකඩවල නොගැලපීම | ඩී.ආර්. ප්‍රනාන්දු | එස්.සමිත, ටී.යු.එස්.පිරිස් |

| පර්යේෂණ ලිපියේ නම | කතෘන්ගේ නම | සම කතෘන් |
|---|---|---|
| තෝරා ගන්නා ලද උක් පවේණියන්ගේ ජෛව ස්කන්ධ සහ සුක්රෝස් සමුච්චයට ඉහළ ගිය උෂ්ණත්වය සහ කාබන්ඩයොක්සයිඩ වල බලපෑම | ඒ.එල්.සී ද සිල්වා | ඩබ්.ඒ.ජේ.එම්.ද කොස්තා එල්.ඩී.බී.සූරියගොඩ |
| UR 11 ජාන සඳහා අණුක සළකුණු වලංගුතාවය | එච්.එම්.පී.එස්.කුමාරි | සී.කේ.වීබැද්දේ, පී.සී.ජී. බණ්ඩාරණායක, එම්.ඒ. පොස්ටර් කොරාල්ස්, ආර්.ජී.ඒ.එස්. රාජපක්ෂ |
| සත්කාරම් දෙමුහුන් සඳහා සංවේදී අවධිය පිළිබඳ බලාගැනීම-උක්වල සුදුපත්‍ර රෝගයේ වාහකයා | කේ.එම්.ජී. චංචලා | කේ.එස්.හේමචන්ද්‍ර, එල්. නුගලියද්දේ, වී.කේ.ඒ.එස්.එම්. වනසිංහ, ඩබ්ලිව්.ආර්.ජී. විතාරම |
| සාදික්කා අස්වැන්න මත මීදුම් (ඩෙල්ටොසෙෆල්ස්නීල්ග්හෙරන්ස වී සහ ආර්න්. වීග්) පරපෝෂිතභාවය. අප එම විනාශකාරී බව අවතක්සේරුවට ලක් කළාද? | එස්.එස්.යාපා | ඒ.ජේ. මෙහොට්ටි, එස්.සමිත |
| තාප පොම්ප වියලනයේ ස්පන්දන පළල මොඩියුලේෂන් පාලනය, කඳුරැලි වාෂ්පීකාරක සහ සමාන්තර ගැලීම් සහිත සමපීඩක භාවිතයෙන් කිරීමං | ඒ.ජේ.ප්‍රනාන්දු | කේ.එස්.පී. අමරතුංග, ඩී.ඒ.එන්.ධර්මසේන, ආර්.එම්.ආර.ඩී.අබේරත්න, අයි.එල්.ගජසිංහ, එච්.එස්.ටී. වීරකෝන්, ටී.එම්.ඒ.සී. ඒකනායක, ඩී.එම්.එස්.පී.බණ්ඩාර |
| පසෙහි ඇති සෙලියුලෝස් වියෝජන හැකියාව එළවළු වගාව සඳහා අහිතකරය. ශ්‍රී ලංකාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සිද්ධි අධ්‍යනයකි | ඩබ්ලිව්.ඒ.එම්.එස්. වික්‍රමආරච්චි | ඩබ්ලිව්.එස්.දන්දෙනිය |
| මොණරාගල දිස්ත්‍රික්කයේ කුඩා රබර්වතු වගාකරුවන්ගේ 1/2S d/2 ටැපින් පද්ධතියේ භාවිතයට හැසිරීම් සාධකයන්ගේ බලපෑම | පී.කේ.කේ.එස්. ගුණරත්න | එච්.වී.ඒ.වික්‍රමසූරිය, එම්.ඩබ්ලිව්.ඒ.පී.ජයතිලක, ඩබ්ලිව්.විජේසූරිය |
| පසෙහි ඇති ක්ෂුද්‍රජීවින් පද්ධතිය වී පැලයේ අයන උරා ගැනීම වැඩි කරයි. | ඩබ්ලිව්.එස්.දන්දෙනිය | වයි.යූ.සී. විජේරත්න, පී.ඩී.බී.ජේ. පලිහක්කාර, වයි.ජේ.පී.කේ. මිත්‍රසේන |

(ඇ) 2. 2021 දී ලද ජාතික හා ජාත්‍යන්තර සම්මාන

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සමුළුව-2021

| සැසිය | ත්‍යාගය/හොඳම පත්‍රිකාව ජයග්‍රහණය කළ පර්යේෂණ කෘතියේ නම සහ අරමුණ | ජාතික/අන්තර්ජාතික | නම/ නම | තනතුර | පීඨය/ දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|---|
| හන්තාන එසෙන්ස්: කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමුළුව සැකවින්-තෙවන ස්ථානය | හන්තාන එසෙන්ස්: කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමුළුව සැකවින්-තෙවන ස්ථානය (ලෝක උෂ්ණත්වය සමගින් උක් ගසට අභියෝග කළ හැකිද?) | ජාතික | ඒ.එල්.චන්ද්‍රජිත් ද සිල්වා | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| හන්තාන එසෙන්ස් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමුළුව සැකවින්-දෙවන ස්ථානය | හන්තාන එසෙන්ස්: කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමුළුව සැකවින්-දෙවන ස්ථානය (ආහාරවල ඇති රෝග සහ ආහාර නරක්වීම වැළැක්වීම සඳහා ගොරකා) | ජාතික | කේ.ටී.එන්.කේ. විජිතසේන | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| හන්තාන එසෙන්ස් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමුළුව සැකවින්-පළමු ස්ථානය | හන්තාන එසෙන්ස්: කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සමුළුව සැකවින්-පළමු ස්ථානය (අත්හැර දමන ලද පෝෂණමල්ල : ආහාරයට ගත හැකි ඌන උපයෝජනයක් සහිත පැළෑටි සහ ඒවායේ පෝෂක හැකියාව පිළිබඳ විමසීමක්) | ජාතික | පී.එස්.පේදුරුහේවා | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| වාචික සැසිය 1 හොඳම ඉදිරිපත් කරන්නා කෘෂිකාර්මික ක්‍රියාවලියේ කොටස්කරුවන්ගේ හැසිරීම | ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය එළවළු වෙළඳපලවල් වල මිල ගණන්වල සබැඳියාව - කොවිඩ් 19 වසංගත කාලයට පෙර හා පසු සංසන්දනය | ජාතික | ඩී.එම්.එන්.ජේ. කුමාරි | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| වාචික සැසිය 2 හොඳම ඉදිරිපත් කරන්නා ආහාර ගුණත්වය සහ පිළියෙළ කිරීම | ශ්‍රී ලංකාවේ ඉතා කුඩා තේ ප්‍රමාණයක් හා ෆයිබර් විශාල ප්‍රමාණයක් අමුද්‍රව්‍ය ලෙස යොදාගනිමින් අඩු මිදුම් ක්ෂණික තේ සාරය නිපදවීම | ජාතික | කේ.ඒ.පී.දල්පතදු | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |

| සැසිය | ත්‍යාගය/හොඳම පත්‍රිකාව ප්‍රදානය කළ පර්යේෂණ පත්‍රිකාවේ නම සහ අරමුණ | ජාතික/අන්තර්ජාතික | නම/ නම | තනතුර | පීඨය/ දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|---|
| වාචික සැසිය 3 හොඳම ඉදිරිපත් කරන්නා කෘෂිකාර්මික නිෂ්පාදනය සහ පරිසරය | විදේශීය තිලාපියා දේශීය මාළුවා මත ඇති කරන බලපෑම - පාරිසරික ඉදිරි දර්ශනයක් | ජාතික | පී.ඒ.සී.ටී. පෙරේරා | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| වාචික සැසිය 4 හොඳම ඉදිරිපත් කරන්නා කෘෂිකර්මාන්තයේ කෘමීන් හා රෝග කළමණාකරණය | ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ ගවයින් හා මී හරක් අතර පැතිර යන ගව ක්ෂය රෝගය පැතිරීම වැළැක්වීම | ජාතික | වයි.එච්.පී.එස්.එන්.කුමාර | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| වාචික සැසිය 5 හොඳම ඉදිරිපත් කරන්නා කෘෂිකර්මාන්තයේ තාක්ෂණික මැදිහත්වීම | කාළගුණ තොරතුරු අපේක්ෂිත භාවිතය පිළිබඳ පසු අධ්‍යයනයක් - ශ්‍රී ලංකාවේ වී වගාව පිළිබඳ අර්ධ පරීක්ෂණයකි. | ජාතික | එන්.එම්.කේ.සී.ප්‍රේමරත්න | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| පෝස්ටර් සැසිය 1 හොඳම ඉදිරිපත් කරන්නා ආහාරවල ගුණත්වය සහ සුරක්ෂිතභාවයේදී කොටස්කරුවන්ගේ හැසිරීම | මඩකලපු දිස්ත්‍රික්කයේ කට්ටකුණ්ඩි ප්‍රදේශයේ ගර්භනී කාන්තාවන්ගේ රක්තහීනතාවය පිළිබඳ දැනුම හා ප්‍රායෝගික පුරුදු තක්සේරු කිරීම | ජාතික | එම්.ආර්.රෝෂන | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| පෝස්ටර් සැසිය 2 හොඳම ඉදිරිපත් කරන්නා ආහාර භෝගවල සහ පළිබෝධ රෝග පාලනය කළමණාකරණය | සහල්වල ප්‍රතිරෝදය අභිජනනය සඳහා ජානමය සම්පතක් ලෙස ශ්‍රී ලංකාවේ කැලෑ සහල් විශේෂිත භාවිතය | ජාතික | ඒ.වී.සී. අභයගුණසේකර | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |

| සැසිය | ත්‍යාගය/හොඳම පත්‍රිකාව ජයග්‍රහණ කළ පර්යේෂණ කෘතියේ නම සහ අරමුණ | ජාතික/අන්තර්ජාතික | නම/ නම් | තනතුර | පීඨය/ දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|---|
| පෝස්ටර් සැසිය 3 හොඳම ඉදිරිපත් කරන්නා අත්හදා බැලීම සහ දත්ත විශ්ලේෂණය | පොල් ටෙස්ටා පිටිවලින් ලබාගන්නා වෙනස් ද්‍රාවකයන්ගේ මධ්‍ය වර්ණාවලී ලක්ෂණ සහ රසායනික විද්‍යා ඇගයීම | ජාතික | කේ.එම්.ආර්.යූ. ගුණරත්න | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| හොඳම ඉදිරිපත් කරන්නා | ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ ගවයන් සහ මී හරක් අතර පැතිර යන ගව ක්ෂය රෝගයවැළැක්වීම | ජාතික | වයි.එච්.පී.එස්.එන්.කුමාර | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි විද්‍යාර්තයන්ගේ සම්මානය - තෙවන ස්ථානය | කාළගුණ තොරතුරු අපේක්ෂිත භාවිතය පිළිබඳ පසු අධ්‍යනයක් - ශ්‍රී ලංකාවේ වී වගාව පිළිබඳ අර්ධ පර්යේෂණයකි. | ජාතික | එන්.එම්.කේ.සී.ප්‍රේමරත්න | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි විද්‍යාර්තයන්ගේ සම්මානය - දෙවන ස්ථානය | ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය එළවළු වෙළඳපොළවල්වල මිල ගණන් වල සබැඳියාව කොවිඩ් 19 වසංගත කාලයට පෙර හා පසු සංසන්දනය | ජාතික | ඩී.එම්.එන්.ජේ.කුමාරි | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආදි විද්‍යාර්තයන්ගේ සම්මානය - ප්‍රථම ස්ථානය | ශ්‍රී ලංකාවේ ඉතා කුඩා තේ ප්‍රමාණයක් හා ෆයිබර් විශාල ප්‍රමාණයක් අමුද්‍රව්‍ය ලෙස යොදාගනිමින් අඩු මීදුම් ක්ෂණික තේ සාරය නිපදවීම | ජාතික | කේ.ඒ.පී.දල්පතදු | ශිෂ්‍ය | කෘ.වි.ප.උ.ආ. |

ඇ.3 2021 වර්ෂය තුළ මහ ජනතාව වෙත දැනුම බෙදා හැරීම පිළිබඳ විස්තර

| ආයතනය | වැඩසටහන් වර්ගය/වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන් /මාධ්‍ය වැඩසටහන් | වැඩසටහන් මාතෘකාව | සංවිධානය කිරීම පීඨය/දෙපාර්තමේන්තුව/මධ්‍යස්ථාන ඒකකය | පැවැත්වූ දිනය | කාලය | ඉලක්කගත කණ්ඩායම | සහභාගි වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පුහුණු වැඩමුළුව | ලෝක ජල දිනය | කැප්නෙට් ලංකා, කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමණාකරණය අන්තර්ජාතික පුහුණු ආයතනය හා එක්ව | 24.03.2021 | 1 | පාසැල් සිසුන් | 80 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වැඩමුළු මාර්ගගත | යාපනය සහ ඊටම ආවේණික ජලය | කැප්නෙට් ලංකා සිංහ සංගමය හා එක්ව | 16.09.2021 | 7.00pm–9.00p.m | ජලය වෘත්ති කයන් | 75 (රට වල් 06කි න්) |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වැඩමුළුව (මාර්ගගත) | ඊළඟ පරම්පරාවේ ජල මැදිහත්වීම- උතුරු පළාත සඳහා සිතුවිලි | කැප්නෙට් ලංකා ව්‍යාපෘතිය උතුරේ තරුණ ජල වෘත්තිකයන්ගේ සමඟ එකතුව | 30.09.2021 | ප.ව. 7.00 - ප.ව 9.00 | තරුණ ජල වෘත්ති කයන් | 25 (රටව ල් 6 කින් ) |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වැඩමුළුව | කැප්නෙට් මූලික කණ්ඩායමේ රැස්වීම - 2021 | කැප්නෙට් ලංකා | 16.12.2021 | ප.ව 1.00 සිට ප.ව 2.30 | කැ ප්නෙට් ලංකාහි මූලික කණ්ඩා යම් සාමාජි කයන් | 12 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වැඩමුළුව | සංඛ්‍යාන විශ්ලේෂණ පද්ධතිය භාවිතයෙන් දත්ත විශ්ලේෂණය | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය එල්.කේ.වීරසිංහ | 17/18.09.2021 | දින 02 | පශ්චාත් උපාධිය හදාරන සිසුන් සහ පර්යේෂ කයින් | 15 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වැඩමුළුව | සඟරාවකට යැවීමේ පටන් ප්‍රකාශනය දක්වා වූ ක්‍රියාවලිය සහ ගමන | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය එස්.ඩී.එස් හේමචන්ද්‍ර | 01.10.2021 | එක්දින | පශ්චාත් උපාධිය හදාරන සිසුන් සහ පර්යේෂ කයින් | 37 |

| ආයතනය | වැඩසටහන් වර්ගය/වැඩමුළුව/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන්/ මාධ්‍ය වැඩසටහන් | වැඩසටහන් මාතෘකාව | සංවිධානය කිරීම සිදුය/දෙපාර්තමේන්තුව/මධ්‍යස්ථාන ඒකකය | පැවැත්වූ දිනය | කාලය | ඉලක්කගත කණ්ඩායම | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | වැඩමුළුව | විද්‍යාව මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කිරීම | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය එන් පෙරේරා | 05.11.2021 | එක් දින | පශ්චාත් උපාධිය හදාරන සිසුන් සහ පර්යේෂකයින් | 18 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පුහුණු වැඩසටහන | වැඩකරන ස්ථානයේ ධනාත්මක මානසිකත්වයක් ඇති කිරීම | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 16.12.2021 | එක්දින | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය | 50 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මාධ්‍ය වැඩසටහන | සමුළු උපුටාගැනීම් පොත | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 17.11.2021 | එක්දින | අධ්‍යයන කාර්ය මන්ඩලය, පශ්චාත් උපාධි හදාරණ සිසුන්, පර්යේෂකයින්, කතෘන් ,සම කතෘන් | 1140 |

| ආයතනය | වැඩසටහන් වර්ගය/වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර/ප්‍රදර්ශනයන්/ මාධ්‍ය වැඩසටහන් | වැඩසටහන් මාතෘකාව | සංවිධානය කිරීම සහය/දෙපාර්තමේන්තුව/මධ්‍යස්ථාන ඒකකය | පැවැත්වූ දිනය | කාලය | ඉලක්කගත කණ්ඩායම | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | සති 05 ක මාර්ගගත පාඨමාලාව | කෘෂිකර්ම ප්‍රතිපත්ති විශ්ලේෂණය | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, යුරෝපා සංගමය මඟින් අරමුදල් සම්පාදිත කෘෂිකර්ම වැඩසටහන් නවීකරණය කිරීමට තාක්ෂණික සහාය ලබාදීමේ වැඩසටහන (TAMAP) සහ මුදල් අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අනුමත කරන ලදී. | 2021 සැප්තැම්බර් 27 වන දින සිට නොවැම්බර් 02 දක්වා | දින 06 | ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම මට්ට මේ රජයේ නිළධාරී න් පෞද්ග ලික අංශයේ විධායක යින්, අධ්‍යය න කාර්ය මණ්ඩල සාමාජි කයන් | 76 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මාධ්‍ය වැඩසටහන | ට්‍රොපිකල් ඇග්‍රිකල්ච(ර්) සඟරාව | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 17.11.2021 | එක්දින | අධ්‍යය න කාර්ය මණ්ඩල සාමාජි කයන්, පශ්චාත් උපාධිය හදාරණ සිසුන්, පර්යේෂ කයින්, කතෘන් සහ සම කතෘන් | 1140 |

ඉ) ජාත්‍යන්තරීකරණය

(ඉ) 1. 2021 වර්ෂයේදී ආයතනය විසින් පවත්වන ලද අන්තර්ජාතික සමුළු සහ වැඩමුළු පිළිබඳ විස්තර

| අංකය | තේමාව | සංවිධානය කිරීම (පීඨය/අධ්‍යයන අංශය/ මධ්‍යස්ථානය/ඒකකය) | පැවැත්වූ දිනය/ කාලසීමාව | ඉලක්කගත කණ්ඩායම | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | වාර්ෂික සම්මේලනය | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 2021 නොවැම්බර් 17 | අධ්‍යයන කාර්ය මණ්ඩලය, පශ්චාත් උපාධි හදාරණ සිසුන්, පර්යේෂකයින් | 1140 |
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති/ විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.49,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය | ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 94 ක් ආරම්භ කර වසර 03 සිට වසර 46 දක්වා කාලයක් ගතවී ඇතත්, එම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය. | වසර 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති වෙත හා භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාවූ වර්ෂයන් සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් විගණකාධිපති වෙත හා අදාළ ආයතන වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර තිබුණු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 වන මාර්ගෝපදේශය | ආයතනය විසින් පවත්වනු ලබන විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩි දියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන නිශ්චිත ක්‍රමවේදයක් සහ ප්‍රමිතින්ද, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා බාහිර ප්‍රවීන ආචාර්යයවරුන්ගේ සහාය ලබාගෙන දෙවනවර පිළිතුරු පත්‍ර ඇගයීමේ විධිමත් ක්‍රමවේදයක්ද පිළියෙල කර පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඨ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඩ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිලධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 31 දෙනෙකු වසර 06 සිට වසර 39 දක්වා කාලයක් එකම ස්ථානයක සේවය කරමින් තිබුණි.

(ආ) කොන්ත්‍රාත් වටිනාකම රු.2,100,000 ක් වූ ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපනය කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.1,050,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වැඩ අවසන් කළ යුතු බවට ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන්වී වසර 03 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් පරිගණක පද්ධතිය ස්ථාපනය කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ආයතනය (International Development Research Centre) විසින් පර්යේෂණ සඳහා ප්‍රදානයකර තිබුණු රු. 1,260,629 ක් වසරක කාලයක් තිස්සේ උපයෝජනය කර නොතිබුණි.

(ඈ) පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත අන්දමින් උපයෝජනය නොකර, 2021 දෙසැම්බර් 31 දින වනවිට රු.25,016,355 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 අවසානයට ආයතනය සතු මුළු වටිනාකම රු.444,427,072 ක් වූ ස්ථාවර තැන්පතු, 2021 දෙසැම්බර් 31 දින වන විට රු.692,976,053 ක් දක්වා රු.248,548,981 කින් එනම් සියයට 55 කින් වැඩිවී තිබුණි. 2017 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු මුළු ප්‍රදාන රු.45,659,896 ක් වූ අතර 2021 වර්ෂය වන විට එය රු.68,307,000 ක් දක්වා රු.22,647,104 කින් එනම් සියයට 50 කින් වැඩිවී තිබුණි. ඒ අනුව ආයතනය සතු ස්ථාවර තැන්පතු ප්‍රමාණය පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී රු.මිලියන 248 කින් පමණ වැඩිවී තිබියදීත් භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලද රාජ්‍ය ප්‍රදාන ප්‍රමාණයද රු.මිලියන 22 කින් වැඩිකර ගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. කේඩීඒ/ඩී/පීජීඅයිඒ/2022/07 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 අප්‍රේල් 04 දින. |

"රහසයායි" (කෙටුම්පත)

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

### 1.1 මතය

මෙම වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් ඔබගේ අදහස් සලකා බැලීමෙන් අනතුරුව මතය තීරණය කරනු ලැබේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු. 9,800,000 ක මෝටර් රථ 03 ක් හා රු.461,243 ක දුරකථන උපාංග තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 88(ඕ) ඡේදය අනුව වෙන් කිරීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත වෙනම දැක්විය යුතු වුවත් රු. 420,000 ක විගණන ගාස්තු වෙන් කිරීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපචිත වියදම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 71 ඡේදය අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු.10,927,827 ක පුස්තකාල තැන්පතු වටිනාකම, ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගැලපීම් කර දක්වා නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ විගණන ගාස්තු වෙන් කිරීම් මත ඇති වූ රු. 5,000 ක අධි වෙන් කිරීම් සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(ඉ) භාණ්ඩාගාර ශේෂ සනාථ කිරීම් අනුව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානය රු.4,870,000 ක් වුවද, ආයතනයට ලැබී තිබුණේ රු.3,800,000 ක් පමණක් බැවින් ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්වල රු.1,070,000 ක වෙනසක් පැවතුණි.

## 1.3 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත<br>25 වන වගන්තිය | ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 94 ක් ආරම්භ කර වසර 03 සිට වසර 46 දක්වා කාලයක් ගතවී ඇතත්, එම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 168 (1) | ඕනෑම නිලධාරියෙකුට රජය වෙනුවෙන් මුදලක් ලැබුණු විට, ඔහු විසින් මුදල් රෙගුලාසි 169 විධිවිධානවලට යටත්ව, නියමිත ආකෘති පත්‍රයෙහි යන්ත්‍රානුසාරයෙන් අංක කරන ලද කාර්යාලීය කුවිතාන්සියක් වහාම නිකුත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු. 11,891,205 ක පර්යේෂණ ප්‍රදාන ලැබීම් සඳහා කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| (ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මුදල් ඇමතිවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල්, ඉල්ලුම් තැන්පතු, කෙටිකාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම ආයෝජනයක් සිදු කළ හැකි වුවත් එවැනි අනුමැතියකින් තොරව රු.49,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු 03 ආයෝජනය කර තිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය. | වසර 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යාපාර |

දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 සිට 2021 දක්වා වර්ෂයන් සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේ දී නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 වන නිර්නායකය. | ආයතනය විසින් පවත්වනු ලබන විභාග සැලසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩි දියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයක් සහ ප්‍රමිතින් සකස් කර පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා හා බාහිර ප්‍රවීන ආචාර්යයවරුන්ගේ සහය ලබාගෙන දෙවනවර පිළිතුරු පත්‍ර ඇගයීමේ විධිමත් ක්‍රමවේදයක්ද සකස් කර පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන සංචාරක නිකේතනයේ පසුගිය වර්ෂ 03 ක කාල පරිච්ඡේදය තුළ උපයන ලද මුළු ආදායම රු.623,570 ක් වූ නමුත් එම කාල සීමාවට අදාළ මුළු වියදම රු.2,915,046 ක් වුයෙන් පසුගිය වසර 03 ක කාලය තුළ ආදායම ඉක්මවා රු.2,291,476 ක වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ආ) විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිලධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 31 දෙනෙකු වසර 06 සිට වසර 39 දක්වා කාලයක් එකම ස්ථානයක සේවය කරමින් තිබුණි.

(ඇ) ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ රු.2,100,000 ක මුදලකට ගිවිසුම් ගත වී අත්තිකාරම් වශයෙන් රු.1,050,000 ක මුදලක් ගෙවා තිබුණද, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 03 කට වැඩි කාලයක් ගත වී ඇතත්, පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණු කළමනාකරණ මණ්ඩල රැස්වීම් 06 සඳහා කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් 05 දෙනෙකු අඛණ්ඩව සහභාගිවී නොතිබුණද, ඒ සම්බන්ධයෙන් 1979 අංක 09 දරන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 11(5) නියමය අනුව එම සාමාජිකයින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය 2021 නොවැම්බර් 30 වන දින සංශෝධනය කර තිබියදීත් වැය ශීර්ෂ 29 ක අයවැය ගත ආදායම්/ වියදම් හා සත්‍ය ආදායම්/ වියදම් අතර සියයට 22 සිට සියයට 245 දක්වා විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) I.D.R.C. ප්‍රදාන යටතේ ලැබී තිබූ රු. 1,260,629 ක පර්යේෂණ ප්‍රදාන මුදලක් වසරක කාලයක් තිස්සේ උපයෝජනය කර නොතිබුණි.

(උ) පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂණ ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත අන්දමින් උපයෝජනය නොකර, එම අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එසේ ආයෝජනය කර තිබුණු මුදල රු.25,016,355 ක් බව නිරීක්ෂණය විය.

(ඌ) 2017 වර්ෂය අවසානයට ආයතනය සතු වටිනාකම රු.444,427,072 ක මුළු ස්ථාවර තැන්පතු ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.692,976,053 ක් දක්වා රු.248,548,981 කින් එනම් සියයට 55 කින් වැඩි වී තිබුණි. 2017 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබූ මුළු ප්‍රදාන ප්‍රමාණය රු.45,659,896 ක් වූ අතර 2021 වර්ෂය වන විට එය රු.68,307,000 ක් දක්වා රු.22,647,104 කින් එනම් සියයට 50 කින් වැඩි වී තිබුණි. ඒ අනුව ආයතනය සතු ස්ථාවර තැන්පතු ප්‍රමාණය පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී රු. මිලියන 248 කින් පමණ වැඩි වී තිබියදීත් භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලද රාජ්‍ය ප්‍රදාන ප්‍රමාණය රු. මිලියන 22 කින් වැඩි කර ගෙන තිබුණි. දෛනික මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ආයතනය සතුව ප්‍රමාණවත් අතිරික්ත මුදල් තිබියදීත්, භාණ්ඩාගාර ප්‍රදාන ලබා ගැනීමට කටයුතු කර තිබූ බවත්, භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රමාණය අඩු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

විගණකාධිපති

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වර්තාව සඳහා පිළිතුර.

1.2 (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 වන ඡේදයේ අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවත්, ප්‍රායෝගිකව වෘත්තිමය තක්සේරු සේවය ලබා ගැනීමේ අපහසුතාවය ,ගත වන කාලය සහ පිරිවැය සලකා බලා ප්‍රමිත අංක 07 හි 64 වන ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමක් මත බෙදා එම ක්ෂය ප්‍රමාණය 62 වන ඡේදය පරිදි අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනා ගැනේ. මෙහිදී මෝටර් රථ 03 සහ දුරකථන උපාංග 2015.01.01 දින ප්‍රත්‍යාගණනය කරන ලද අතර ඒවා 2021.12.31 වැනි දින වාර්ෂික ක්ෂය ගැලපීම මඟින් ශුන්‍ය අගයක් ගන්නා අතර ගිණුම්කරණ වර්ෂයේදී අගයක් සහිතව පැවතුණි. මෙම වත්කම් 2022 වර්ෂයේදී ප්‍රයෝජනවත් ජීවිත කාලය සළකා ප්‍රත්‍යාගණනය කරන අතර එම අගයන් ගිණුම්ගත කර යළිත් ක්ෂය ගළපමින් ඉදිරියට යන්නෙමු.

මෙහිදී 2021 වර්ෂය තුළදී ශුන්‍ය අගයක් වූ වත්කම් පාවිච්චි නොකරන ලද බැවින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් පැන නොගනින බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව ප්‍රතිශෝධනයක් (නො) කළ යුතු බව දන්වා සිටිමි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 88 ඡේදයෙහි සරලව දක්වා ඇත්තේ මූල්‍ය තත්තව ප්‍රකාශන මුහුණතෙහි වෙනම ඉදිරිපත් කිරිමට යෝග්‍යය, ස්වභාවයෙන් හා ක්‍රියාකාරිත්වයෙන් සෑහෙන තරම් වෙනස් වන අයිතම ලේඛනයක් බව එම ප්‍රමිතයෙහි 90 වැනි ඡේදයේ සඳහන් වන අතර එහිම (ආ) ඡේදයන් අස්තිත්වයේ මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීමට අදාළ වන පරිදි තොරතුරු ඉදිරිපත් කිරිම සඳහා, භාවිතා කරන විස්තර කිරිම් සහ අයිතම ඉදිරිපත් කරන අනුපිළිවෙල හෝ සමාන අයිතම සමාහරණය කිරිම, අස්තිත්වයේ සහ ගණුදෙනුවල ස්වභාවය අනුව සංශෝධනය කරගත හැකි බව පෙන්වා දෙයි. ඊට අනුගත වෙමින් නව විගණන පනතින් පසුව පසුගිය වර්ෂවලදි දරණ ලද විගණන ගාස්තුව සලකා 2022 වර්ෂයේ නිශ්චිතවම පැන නගින විගණන ගාස්තුව උපචිත වියදමක් සේ ස්වභාවය අනුව හඳුනාගෙන සටහන් අංක 10 හි පැහැදිලි ලෙසින් පෙන්වා ඇත. සියළුම උපචිත වියදම් හා වෙන්කිරිම් (අයිතම 45 ක්) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණත පෙන්වීමේ හැකියාවක් නොමැති අතර මුහුණතෙහි සඳහන් උපචිත වියදම් හා වෙන්කිරිම් අගය අතිරේක සටහන් මඟින් සනාථ කර ඇත.

එමෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1හි 94 වගන්තියේ (ඉ) ඡේදය අනුව ප්‍රතිපාදන වල සමාහරණය සේවක ප්‍රතිලාභ හා අනෙකුත් තිරණය කරන ලද අයිතම සඳහා ප්‍රතිපාදන ලෙස දක්වා ඇත. මෙහිදි විගණන ගාස්තුව ප්‍රතිපාදනයක් ලෙසම මූල්‍ය ප්‍රකාශනයේහි මුහුණතේ පෙන්විය යුතුම යන්නක් සඳහන් නොවේ.

(ඇ) පුස්තකාල තැන්පතු ඉල්ලූ විටක ගෙවිය යුතු වන වගකීමකි. මෙහිදි ප්‍රයෝගික තත්ත්වය වනුයේ ශිෂ්‍යන්ට පාඨමාලා හැදෑරීම සඳහා ලබා දි ඇති උපරිම හා අවමකාල පරාසය තුල ඕනෑම අවශ්ථාවකදි පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරිම, බැහැර යාම, අතහැර යාම, ඉහල දැමීම (Upgrade the Degree), පහල දැමීම ( Downgrade the Degree) යන ඕනෑම කාරණාවක් ඉටු කර ගත හැකි වීම පුස්තකාල තැන්පතු ඉල්ලීම කවර අවස්ථාකදී කෙරේද යන්න නිශ්චිතවම නිර්ණය කළ නොහැකි වීමයි. ඒ අනුව වසර දෙකක පශ්චාත් උපාධිය වසරකින් නිම කල හොත් ජංගම නොවන වගකීම, ජංගම වගකීම් සනයට වැටේ. මෙය ඉතා සංකීර්ණ ක්‍රියා වලියකි. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරණ ප්‍රමිත 1 හි 70 වන ඡේදය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන වගකිම් ලෙස හඳුනාගෙන පෙන්විය යුතු බව සඳහන් වුවද 74 වන ඡේදයෙන් ද්‍රවශීලතාවය අනුව ඉදිරිපත් කිරිමේ ඉඩ ප්‍රස්තාවත් 81 වන ඡේදයේ අස්ථිත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය පැහැදිලිව හඳුනා ගත නොහැකි විට එම කාල සිමාව මාස 12 ක් යැයි උපකල්පනය කර වගකීම වර්ගිකරණය කල හැකි බව සඳහන්ය. ඒ අනුම ජංගම හා ජංගම නොවන වගකිම් ලෙස හඳුනාගැනිම නිවැරදිව, පැහැදිලිව කළ නොහැකි වන පුස්තකාල තැන්පතු ජංගම වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්විම නිවැරදිය.

(ඈ) 2021 වර්ෂය වෙනුවෙන් වෙන්කිරීම් ලෙස 425,000.00 ක මුදලක් ගිණුම්ගත කළ අතර එහි වියදම 420,000.00 ක් වූ බැවින් වෙන්කිරීම් ගිණුමෙ ඉතිරි වූ රු.5,000.00 ක මුදල ප්‍රමාණාත්මක නොවන බැවින් නැවත පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් නොකරන ලද අතර එය මෙම වර්ෂයේදී ඉදිරියට ගෙන වෙන්කිරීම් ගිණුමෙහි ප්‍රමාණයට එකතු කර මුළු අගයම ගිණුම්වල පෙන්නුම් කර ඇත. මෙහිදී 2021.12.31 දිනට පෙන්වන ලාභයට කිසිදු බලපෑමක් ඇති නොවේ.

(ඉ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුවෙන් රුපියල් හේතුවෙන් මිලියන 4.87 ක ප්‍රමාණයක් අප ආයතනය වෙත නිදහස් කර දෙන ලෙස දක්වා තිබුණත් එම ප්‍රමාණය නිදහස් කිරීමක් සිදු නොවන අතර එම ප්‍රමාණයෙන් ආයතනයට ලබාදෙන ප්‍රමාණය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් තීරණය කර සිදුකරනු ලබන අතර එහිදී අප ආයතනයට මිලියන 3.8 ක මුදලක් ප්‍රාග්ධන වියදම් වශයෙන් සත්‍ය ලෙස නිකුත් කළ බව අදාළ ලේඛනවලින් පෙන්නුම් කරයි. අදාල ලේඛණය රජයේ විගණන අංශය වෙත ලබා දෙන ලදි..
(ඇමුණුම් අංක 04 ,05 ,06)

2.2.2 .(අ) අප ආයතනය මඟින් පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සඳහා 2017 පෙබරවාරි මස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇති බව ප්‍රකාශ කරමි.

(ආ) අප ආයතනය වෙත යම් ප්‍රදානයක් චෙක්පත් මාර්ගයෙන් ලැබෙන්නේ නම් හෝ මුදල්මය වශයෙන් ගෙනවිත් භාර දෙන්නේ නම් මුදල් රෙගුලාසි 168 (1) හා 169 ප්‍රකාරව යන්ත්‍රානුසාරයෙන් අංකනය කරන ලද කාර්යාලීය කුවිතාන්සියක් වහාම නිකුත් කිරිමක් කරයි. නමුත් නූතන ඉලෙක්ට්‍රොනික් මුදල් හුවමාරු ක්‍රම යටතේ දේශිය හා විදේශිය මුදල් මාරු කිරිමේදි චෙක්පත් ලබාදිමක් සිදු නොවන අතර අප ආයතනික ගිණුමට මුදල් මාරුකර අදාල පර්යේෂණ

සම්බන්ධීකාරකට විද්‍යුත් තැපැල මගින් දැනුම්දීමක් කරනු ලබයි. අදාළ පර්යේෂණ සම්බන්ධීකාරක විසින් මුදල් ලැබීම අපගේ ගිණුම් අංශය මගින් සනාථ කරගෙන පර්යේෂණ ප්‍රදානය කරන ආයතනයට විද්‍යුත් තැපැල හරහා ඒ බව දැන්වීමක් කෙරේ. නමුත් මෙහි දක්වා ඇති සෑම පර්යේෂණ ලැබීම් කුවිතාන්සි පොතෙහි සඳහන් කර ගිණුම් වලට ගෙන ඇත. එමෙන්ම සමහර පර්යේෂණ ප්‍රදාන ආයතනය විසින් කුවිතාන්සි ඉල්ලීමක් කරන අවස්ථාවේදී ආයතනය විසින් කුවිතාන්සි නිකුත් කර ඇත. බොහෝවිට Cap Net project විසින් මෙම ඉල්ලීම කරනු ලබයි. බැංකු ගිණුම් දෙකක් හරහා තුන්වන පාර්ශවයකගේ මැදිහත් වීමක් මෙම මූල්‍ය ගණුදෙනු සිදුවන බැවින් එම ලිපි ලේඛන මුදල් මාරු කිරීමේ සාක්ෂි ලෙස එම ආයතන භාවිත කරන බැවින් මෙම කුවිතාන්සිය පිළිබඳව ඔවුන් එතරම් සැලකිල්ලක් නොදක්වයි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍ර ලේක අංක 02/2019 සහ 04/2019 යන චක්‍ර ලේඛනයන්ට අනුකූලව වසර අවසානයට ආයතනයේ ජංගම ගිණුම්වල පවතින අතිරික්ත ශේෂ ඵලදායක අයුරින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා ආයතනයේ 2021.12.17 වැනි දින පැවති 67 මූල්‍ය කමිටු වැනි නිර්දේශය සහ එදිනම පැවති කළමණාකරණ කමිටු අනුමැතියට යටත්ව 2021.12.30 රු.49,000,000.00 ක කෙටිකාලීන ස්ථාවර තැන්පතු ආයෝජනයක් කර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මුදල් ඇමතිවරයාගේ අනුමැතියට යොමුකරන ලදී. 2022 පෙබරවාරි මස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය (ඇමුණුම් අංක 01) මෙයට ලැබුණු අතර 2022 මාර්තු මස 09 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අමාත්‍ය අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා මුදල් ආයෝජනය කරන ලද බැංකු ශාඛාව සඳහන් කර එවන ලෙස දැනුම්දීමක් කරන ලදී. (ඇමුණුම් අංක 02 සහ 03 ) මේ අනුව අනුමැතිය ලබාගැනීමේ ක්‍රමවේදය කෙරෙමින් පවතී.

මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා මාස 3 කට වැඩි කාලයක් ගතවන නිසාත් මිල ප්‍රකාශනයක වලංගු කාලය දින 3ක් පමණක් වන නිසාත් අනුමැතිය ලබාගැනීමෙන් පසු ආයෝජන කටයුතුවල නියලීමේදී වර්ෂ අවසාන අතිරික්තය නියමිත දිනම ආයෝජනය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවන බැවින් ආයතනයේ පාලක මණ්ඩල අනුමැතීන් සහිතව ආයෝජනය කර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමුකරමි.

(ඈ) විගණන නිරීක්ෂණය සමඟ එකඟවෙමි. නමුත් දැනට ක්‍රියාත්මක වන 2022 -2026 සංයුක්ත සැලැස්ම මේ වන විටත් අදාළ ආයතනවලට යොමු කර ඇත.

2.2.3. ආයතනය විසින් පවත්වනු ලබන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම යන කාර්යයන් බාහිර ආචාර්යවරුන් විසින් සිදු කරනු ලැබේ. එක් එක් පාඨමාලා උගන්වන ගුරුවරුන් එකතුව මෙම කාර්යයන් සිදු කරන අතර ඒවා අධ්‍යයන මණ්ඩල මගින් ශ්‍රේණිගත කරනු ලබයි. එම ප්‍රතිඵල කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කිරීමෙන් පසුව පාලක සභාව මගින් අනුමත කරයි. මෙම ක්‍රියාවලිය පශ්චාත් උපාධි ආයතන තුල වෙන වෙනම සිදු කරන අතර දැනට මෙම ක්‍රියාපටිපාටිය විශ්වවිද්‍යාලය තුල සමස්තයක් ලෙස ඒකාකාරී ලෙස සිදු කිරීම සඳහා පශ්චාත් උපාධි ආයතන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ඒ සඳහා සැලසුම් පිළියෙල කරමින් පවතී.

2.2.4.(අ) පසුගිය කාලය පුරාවට පැවති වසංගත තත්ත්වය මත සෞඛ්‍ය අංශ මගින් අමුත්තන්ගේ පැමිණීම සීමා කිරීම මෙහි ආදායම පහත වැටීමට හේතු වූ ප්‍රධාන කරුණක් වේ. මේ වන විට මෙහි අමුත්තන්ගේ පැමිණීමේ වර්ධනයක් දැකගත හැක.

ඉදිරියේදී ආයතනයේ හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සියලුම විදේශීය පශ්චාත් උපාධි සිසුන්, ආචාර්යවරුන් හා පර්යේෂකයන් සඳහා අවශ්‍යතාව මත නවාතැන් පහසුකම් සැපයිය හැකි ආකාරයට මෙහි නවීකරණ කටයුතු සිදුකර අනෙකුත් සියලුම පහසුකම් වැඩිදියුණු කිරීම ආරම්භ කර ඇති අතර මෙමගින් මෙහි ආදායම් තත්ත්වය වැඩිකර ගැනීම අපේක්ෂා කෙරේ. එසේම ආයතනයට හා විශ්ව විද්‍යාලයට විදේශීය සිසුන් ආකර්ශනය කර ගැනීමට මෙය පිටිවහලක් වනු ඇත.

එසේම මෙම සංචාරක බංගලාව විවෘත වෙළඳපල සඳහා විවෘත නොවූවක් බව තව දුරටත් පැහැදිලි කල යුතු වේ. පශ්චාත් උපාධි ක්ෂේත්‍රයේ නියුතුවූවන් හට යටිතල සේවාවන් පවත්වාගෙන යාමේ අරමුණින් පවත්වා ගෙන මෙම ආයතනය චක්‍රාකාරයෙන් ආයතනයේ පාඨමාලා ප්‍රවර්ධනය කිරීමේ ඒකකයක් ලෙස ක්‍රියා කර ආයතනයේ අදායමට දායක වේ. මේ හේතුවෙන් සාමාන්‍ය මට්ටමේ ආයතනයක ලාභ ආලාභ මැනීමේ සැළකිල්ලට ගන්නා කරුණු මේ සඳහා අදාළ කර ගැනීම නිවැරදි නොවන බව පැහැදිලි කරමි.

(ආ) විධිමත් මාරුවීමේ ප්‍රතිපත්තියක් තිබිය යුතු බව පැහැදිලිව පිළිගනිමි. නමුත් අප ආයතනය විශ්වවිද්‍යාලයෙන් පරිභාහිරව වෙනම ජාතික ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇති නිසා ඒ සඳහා වෙනම cadres ලබා දී ඇති නිසාද විශ්ව විද්‍යාලය මගින් අනුගමනයට කරනු ලබන මාරුවීමේ ක්‍රමවේදය සඳහා අප කාර්ය මණ්ඩලය අයත් කර නොගනී. කළමණාකාරීත්වයේ අභිමතය පරිදි මේ සඳහා සාකච්ඡා කර ඉදිරියේදී ක්‍රියාමාර්ගයන් ගැනීමට නියමිතය.

(ඇ) ගිවිසුමට අනුව මෙම පරිගණක පද්ධතිය වර්ෂයක කාලයක් තුළ ස්ථාපිත කළ යුතු වුවත් මෙම වසර 4 ක කාලයක් පුරා පැවති වැඩවර්ජන, කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම මත එය නියමිත දිනයට නිම කළ නොහැකි විය. නමුත් 2021 වර්ෂයේ දෙසැම්බර් මස පැවති විගණන හා කළමණාකරණ කමිටුවේදී දෙපාර්ශවයේම කරුණු සැළකිල්ලට ගනිමින් 2022.03.31 දිනෙන් අවසන් වන කාර්තුවේ පරිගණක පද්ධතියේ ලැබෙන කාර්තු ගිණුම් ප්‍රකාශනය සසදා පද්ධතියේ වලංගුභාවය නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත්වන්නේ නම් පරිගණක පද්ධතිය භාරගෙන ඉන් කටයුතු කරගෙන යාමට නිර්දේශ ලබාදෙන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ දී පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන්නෙමි.

(ඈ) විගණන නිරීක්ෂණයට එකඟවෙමි. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යවස්ථාවට අනුකූලව මේ සඳහා වෙනත් පදවියක් දරණ පුද්ගලයෙකු පත්කළ නොහැකි නිසා ව්‍යාකූල තත්ත්වයක් පවතී. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සිට අදාළ පර්ශවයන් දැනුවත් කර කළමණාකරණ මණ්ඩලය තුළ සාකච්ඡා කර තීරණයක් ගැනීමට නියමිතය.

(ඉ) රටෙහි පැවති කෝවිඩ් 19 වසංගතය හමුවේ සැලසුම් කරන ලද ආදයම් ලබාගැනිමට හෝ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීමට හෝ අප ආයතනයට ද හැකියාවක් නොලැබුණි.රටෙහි සාමාන්‍ය තත්ත්වයක් පැවති අවස්ථාවේදි ගිණුම් වර්ෂයෙන් සමාසයක් ගතවෙද්දිම අයවැය ලේඛනය සංශෝධනයට ලක් කොට තාත්ත්විකව ඊට මුහුණ දීමට ආයතනය කටයුතු කර ඇත. නමුත් මෙම අවස්ථාවේදි එය දුෂ්කර කාර්යක් වූ බැවින් (ඩොලර් සංචිත හිඟ වීම නිසා රටේ පැන නැගි ඇති අර්බුදය, උද්ධමනය, ආනයනික සීමා වැනි අයවැය ලේඛනයට සෘජු ව බලපාන ආර්ථික සංසිද්ධින් හා සියල්ලටම වඩා කොරෝනා වසංගතයේ ආර්ථික කටයුතු කෙරෙහි සිදු කර ඇති බලපෑම) අයවැය ලේඛනයේ සංශෝධන කටයුතු නොවැම්බර් 30 වැනි දිනට සිදු කිරීමට සිදු විය.

රට යථා තත්ත්වයට පත් වී මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගන ලද කල පෙර පරිදිම මාස 06 කට පසු අයවැය ලේඛනයට අවශ්‍ය සංශෝධයන් කිරිමට අපි කටයුතු කරන්නෙමු.

(ඊ) IDRC ප්‍රදානය පශ්චාත් උපාධි හදාරන සිසුන්ගේ පර්යේෂණ දිරිගැන්වීම උදෙසා ලබාදෙන්නකි. මෙහිදි එම තොරාගත් සිසුන්ට දිමනා ගෙවිමත්, පර්යේෂණ වියදම් දැරිමත් සිදු කෙරේ.මෙම සිසුන්ගේ පර්යේෂණ තවමත් කෙරිගෙන යන බැවින් ඉදිරියේදි එම වියදම් ආවරණය කිරිම පිණිස ප්‍රදානය අවසන් නොකර තිබේ.

(උ) දීර්ඝ කාලයක් පුරා දිවෙන පර්යේෂණ කටයුතු සඳහා ලැබුණ අරමුදල් දීර්ඝ කාලිනව ඵලදායි නොවන අයුරින් ජංගම ගිණුමක තැන්පත් තබානවාට වඩා එය ඵලදායි අයුරින් එම බැංකුවේම ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරිමට කටයුතු යොදන ලදි. මේ අනුව පර්යේෂණ කටයුතු සඳහා මුදල් අවශ්‍ය වු විටෙක ස්ථාවර තැන්පතු උපලබ්ධි කොට පර්යේෂණ ගිණුමට මුදල් මාරු කිරිමක් කෙරේ. අරමුදල ලැබි තිබුණු අරමුණ හා කාර්යයන් සඳහාම පමණක් භාවිතා කිරිමට පර්යේෂණ ප්‍රධාන සම්බන්ධිකාරක කටයුතු කරයි.

පර්යේෂණ ප්‍රදානය ලබාදෙන්නා විසින් ප්‍රගති වාර්තාවක් ලබාගනිමින් පර්යේෂණයේ ප්‍රගතිය සමාලෝචනය කෙරේ. ඒ සඳහා පාලනයක් පවති.

2021 ගිණුම් වර්ෂයේ දී අපේක්ෂිත පර්යේෂණ කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකර ගැනීමට නොහැකි වුයේ කොවිඩ්-19 වසංගතය නිසාවෙනි. නමුත් එවන් බාධාකාරි වතාවරණයක් තුල වුවද 2021 වර්ෂයේ මුළු පර්යේෂණ ලැබිම් රු. 14,669,601.08 ක් හා වියදම් රු. 15,560,025.76 ක් ලෙසින් වාර්තා කළෙමු. එහෙයින් මෙම පර්යේෂණ ප්‍රදාන අදාල පර්යේෂණ කටයුතු සඳහා වියදම් නොකර අරමුදල් වශයෙන් ආයතනය තුල පවත්වාගෙන යන බව දැක්වීම නිවැරදි නොවේ.

(ඌ) කෘෂිකාර්මික විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පුනරාවර්තන වියදම් කාණ්ඩය යටතේ වැටුප් හා වේතන සඳහා පමණක් මුදල් ප්‍රතිපාදන ලබාදෙන අතර ප්‍රාග්ධන වියදම් සඳහා සුළු ප්‍රතිපාදනයක් ලබාදෙයි. එම ප්‍රතිපාදන අදාළ කාර්යයන් සඳහාම වැය කර ඇත. අනෙකුත් සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ආයතනයේ ඉපැයීම්වලින් කළ යුතු වන්නේය. මේ අනුව ස්ථාවර තැම්පතු පොළී ආදායම හා පාඨමාලා ආදායමෙන් 20% ක් වූ ආයතනික ආදායම ප්‍රධාන කොටගත් අනෙකුත් ප්‍රමාණාත්මක නොවන ලැබීම්වලින් එම වියදම් පියවාගන්නෙමු.

ස්ථාවර තැම්පතුවල පවතින්නේ පේරාදෙණිය හා කොළඹ ශාඛාවල ශිෂ්‍යයින් විසින් ගෙවනු ලබන පාඨමාලා සහ අනෙකුත් ගාස්තුවල වසර 2-7 දක්වා වූ කාලයක් පුරා විලම්භනය වන වියදම් සඳහා වන මුදල, දේශකවරුන්ගේ නොඉල්ලන ලද නමුත් දිනෙක ගෙවිය යුතු දේශන ගාස්තු, වසර 10 ක උපරිම කාලසීමාවක් පුරා පවතින පුස්තකාල තැම්පතු ආදිය වේ. එම ප්‍රාග්ධන මුදල මෙහෙයුම කටයුතු සඳහා භාවිත කළ නොහැක.

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ මෙතෙක් බඳවා නොගෙන තිබූ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම මත ඉහළ ගිය ප්‍රතිපාදනයන් වෙනුවෙන් භාණ්ඩාගාරයේ වැටුප් හා වේතන වෙනුවෙන් ලබාදෙන පුනරාවර්තන ප්‍රදානය ඉහළ නංවා ඇති අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමිත කොට ඇත.

2021 වර්ෂයේදී මිලියන 138 ක් වූ මුළු මෙහෙයුම් වියදවලින් මිලියන 73 ක් (මුළු මෙහෙයුම් වියදමින් 53%ක්ම) ආයතනයේ ඉපැයීම්වලින් ආවරණය කරගෙන තිබේ. එමෙන්ම ප්‍රාග්ධන වියදිමින් 75% ක්ම දරා ඇත්තේ ආයතනයේ ඉපැයීම්වලිනි. මේ අනුව භාණ්ඩාගාරයේ ප්‍රධාන ආයතනයේ අවශ්‍යතා හඳුනාගැනීම මත ඒ සඳහා පමණක් ලබා දී ඇත.







MBA Orientation








Annual Congress 2021







CAP-NET Lanka Project